
# වාර්ෂික වාර්තාව 2016




## සීමාසහිත සීනෝර් පදනම

## අන්තර්ගතය


| | | |
|---|---|---|
| 01. | ආයතනික තොරතුරු | 2-3 |
| 02. | දැක්ම, මෙහෙවර සහ අරමුණු | 4 |
| 03. | සමාගමේ ඉතිහාසය | 5 |
| 04. | සභාපතිතුමාගේ සමාලෝචනය | 6-7 |
| 05. | අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව | 8-9 |
| 06. | 2016 වර්ෂය තුල ලබාගත් ජයග්‍රහණ | 10-14 |
| 07. | 2016 වර්ෂයේ මූල්‍ය කාර්යය සාධනය | 15 |
| 08. | අනාගත සැලසුම් | 16 |
| 09. | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව | 17-33 |
| 10. | මූල්‍ය ප්‍රකාශන | 34-59 |

# ආයතනික තොරතුරු

## සමාගමේ නම සහ ලිපිනය

සීමාසහිත සී - නෝර් පදනම
නො: 335, ඩී. ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10

## නෛතික පසුබිම

1982 අංක 17 දරණ සමාගම් පනතට හා අනතුරුව 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුල සංස්ථාගත කල සමාගමකි.

## අධ්‍යක්ෂ මණ්ඩලය

| | | |
|---|---|---|
| බී. කේ. ජගත් පෙරේරා මයා | - | සභාපති |
| ආර්. එල්. ඒ. ද මෙන්ස් මයා | - | කළමනාකාර අධ්‍යක්ෂ |
| කේ. ඒ. එස්. එස්. කේ. පෙරේරා මයා | - | අධ්‍යක්ෂ (මහා භාණ්ඩාගාර නියෝජිත) |
| සී. ආර්. මුණවීර මයා | - | අධ්‍යක්ෂ |
| එල්. එම්. කේ. මුතුකුමාරණ මයා | - | අධ්‍යක්ෂ |
| එච්. එල්. තිසේරා මයා | - | අධ්‍යක්ෂ |

## සමාගම් ලේකම්

ආනන්ද සිරිසේන සහ සමාගම,
නො. 70/2/3B/ දෙවන මහල,
වයි.එම්.බී.ඒ. ගොඩනැගිල්ල,
ඩී. එස්. සේනානායක මාවත,
බොරැල්ල

## විගණකවරු

විගණකාධිපති දෙපාර්තමේන්තුව,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල

## බැංකුකරුවෝ

ලංකා බැංකුව,
කොළඹ 01

හැටන් නැෂනල් බැංකුව,
නගර ශාඛාව,
කොළඹ 01

මහජන බැංකුව,
රැජින ශාඛාව,
කොළඹ 10

## බෝට්ටු යාත්‍රාංගන

මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගනය,
නො. 25, හැඳල තොටුපල පාර,
මට්ටක්කුලිය
කොළඹ 15

මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගනය, (කැළණි ගඟ අසබඩ)
නො. 135, හැඳල තොටුපල පාර,
මට්ටක්කුලිය
කොළඹ 15

සීනෝර් බෝට්ටු යාත්‍රාංගනය,
කරෛනගර්

## ISO තත්ත්ව සහතිකය

2009 වර්ෂයේ සිට බෝට්ටු නිෂ්පාදනය පිළිබඳ ISO 9001 – 2015 තත්ත්ව සහතිකය පිරිනමන ලද රාජ්‍ය සමාගමකි.

## හවුල් ව්‍යාපාර

| | | |
|---|---|---|
| සීනෝර් ඔරියන්ට් මුහුදු කෑම අවන්හල,<br>නො. 335, ඩී. ආර්. විජේවර්ධන මාවත,<br>කොළඹ 10 | - | සීමාසහිත සීනෝර් පදනම සහ සීනෝර් ඔරියන්ට් පර්ල් සමාගම සමග 1998 ජූලි මස 04 වන දින සිට 2018 ජූලි මස 04 වන දින දක්වා අවුරුදු 20 ක කාලයක් සඳහා මාසික කුලියක් සහ ලාභාංශ බෙදාගැනීමේ පදනම මත අත්සන් කරන ලද කළමනාකරණ ගිවිසුමක් යටතේ ක්‍රියාත්මක වේ. |
| මත්තුමගල කාර්මික වැඩහල,<br>නො. 31 A, ගල් උඩුපිට පාර,<br>මත්තුමගල | - | සීමාසහිත සීනෝර් පදනම සහ ෆ්‍රොන්ටියර් ඔටෝ මෝටිව් පුද්ගලික සමාගම සමග 2006 අගෝස්තු මස 17 වන දින සිට 2021 අගෝස්තු මස 16 වන දින දක්වා අවුරුදු 15 ක කාල සීමාවක් සඳහා ව්‍යාපාරයෙහි ලාභ බෙදාගැනීම සහ මාසිකව කුලියක් ලබා දීමේ පදනම මත අත්සන් කරන ලද කළමනාකරණ ගිවිසුමක් යටතේ ක්‍රියාත්මක වේ. |

## අපගේ දැක්ම

ශ්‍රී ලංකාව තුළ ධීවර යාත්‍රා සහ විනෝද යාත්‍රා නිෂ්පාදනයේ මෙන්ම අනෙකුත් ෆයිබර් ග්ලාස් ආශ්‍රිත නිෂ්පාදන වල ප්‍රමුඛයා බවට පත් වීම හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත් යාත්‍රා නිෂ්පාදකයකු බවට පත් වීම.

## අපගේ මෙහෙවර

තරඟකාරී මිල ගණන් යටතේ ඉහළ ප්‍රමිතියකින් යුතු ධීවර යාත්‍රා සහ ධීවර ආම්පන්න සපයන කාර්යක්ෂම හා ඵලදායී ආයතනයක් ලෙස කටයුතු කිරීම.

## අපගේ අරමුණු

- ෆයිබර් ග්ලාස් බෝට්ටු අපනයනයේ පිළිගත් අපනයනකරුවෙකු බවට පත් වීම.
- ජාත්‍යන්තරයේ කීර්තිමත් ෆයිබර් ග්ලාස් බෝට්ටු නිෂ්පාදකයෙකු බවට පත් වීම.
- විදේශ රටවල් තුළ ෆයිබර් ග්ලාස් බෝට්ටු නිෂ්පාදනයේ ආයෝජිතයෙකු බවට පත් වීම.
- විශිෂ්ඨ පාරිභෝගික සේවා සපයන්නෙකු වීම.
- ඉහළ ප්‍රමිතියකින් යුතු ධීවර බෝට්ටු සහ ධීවර ආම්පන්න සැපයීම තුළින් ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීමේ වඩාත් ඵලදායී අනුග්‍රාහකයෙකු වීම.

# සමාගමේ ඉතිහාසය

ශ්‍රී ලාංකීය ධීවර ප්‍රජාවගේ අධ්‍යාපන සහ සුභසාධක කටයුතු ඉහළ නැංවීමේ අරමුණින් 1967 නෝර්වේජියානු රාජ්‍ය නොවන සංවිධානයක ආධාර මත ලාභ අරමුණු කර නොගත් රාජ්‍ය නොවන සංවිධානයක් ලෙස සීනෝර් සංවර්ධන පදනම ආරම්භ කරන ලදී. අනතුරුව 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරාගත් වෙළඳ ව්‍යාපාර පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත යටතේ සීනෝර් සංවර්ධන පදනම **"සීමාසහිත සීනෝර් පදනම"** ලෙස සංස්ථාගත කර ඇත. ආරම්භයේ සිට කාලයාගේ ඇවෑමෙන් මෙම සංවිධාන ව්‍යුහයෙහි සිදු වූ වෙනස්කම් පහත පරිදි දක්වා ඇත.

1967 නෝර්වේජියානු රාජ්‍ය නොවන සංවිධානයක් වන නෝර්වේ ගොඩ්ටෙම්ප්ලර් උන්ග්ඩෝම්ස් පෙර්බන්ඩ් වෙතින් ලත් ආධාර ප්‍රයෝජනයට ගනිමින් සීනෝර් සංවර්ධන පදනම පිහිටුවා එහි කටයුතු ඇරඹීය.

1971 1938 අංක 51 දරණ සමාගම් ආඥා පනත යටතේ ඇපයෙන් සීමිත පොදු සමාගමක් ලෙස සංස්ථාගත කොට සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම යන නමින් හැඳින්වීය.

1985 ශ්‍රී ලංකා රජය විසින් 1971 අංක 35 දරණ වෙළඳ ව්‍යාපාර පවරා ගැනීමේ පනත යටතේ රජයට පවරාගත් අතර රජයට පවරාගත් සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම නමින් හැඳින්වීය.

1990 1987 අංක 23 දරණ රාජ්‍ය සංස්ථා හෝ රජයට පවරාගත් වෙළඳ ව්‍යාපාර පොදු සමාගම් බවට පරිවර්තනය කිරීමේ පනත ක්‍රියාත්මක වීමෙන් රජයට පවරාගත් සීමාසහිත සීනෝර් සංවර්ධන පදනම අහෝසි වී එහි අනුප්‍රාප්තිකයා ලෙස කටයුතු කිරීමට 1982 අංක 17 දරණ සමාගම් පනත යටතේ 1990.01.17 වන දින සීමාසහිත සීනෝර් පදනම සංස්ථාගත කරනු ලැබ ඇත.

මෙම නව සමාගමේ සම්පූර්ණ කොටස් ප්‍රාග්ධනය (රු. 40,000,000/-) භාණ්ඩාගාරයේ ලේකම් වෙත වෙන් කර ඇත.

2011 අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිතව රජය විසින් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණයකට අනුව සීමාසහිත සීනෝර් පදනම යටතේ පැවැති ලුණුවිල සහ වීරවිල මාළුදැල් කර්මාන්ත ශාලා දෙක 2011 නොවැම්බර් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්ප්‍රදායික කර්මාන්ත හා කුඩා ව්‍යවසාය අමාත්‍යාංශය යටතේ පවත්වා ගෙන යාම සඳහා සීමාසහිත නෝර්ත් සී ආයතනයට පවරා දී ඇති අතර නෝර්ත් සී ආයතනය යටතේ පැවති යුද්ධයෙන් විනාශ වූ කරෙයිනගර් බෝට්ටු යාත්‍රාංගනය සීනෝර් පදනම වෙත පවරා දී ඇත.

# සභාපතිතුමාගේ සමාලෝචනය

සීමාසහිත සීනෝර් පදනමෙහි සභාපතිවරයා ලෙස 2016 මාර්තු 14 වන දින රාජකාරී භාරගැනීමෙන් අනතුරුව ඉතා සාර්ථක ලෙස නිම කරන ලද 2016 දෙසැම්බර් මස 31 වනදායින් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත පිරිනමනු ලබන්නේ ඉතාමත් සංතෝශයෙනි.

සීමාසහිත සීනෝර් පදනම සතුව පැවැති වීරවිල හා ලුණුවිල මාළු දැල් කර්මාන්ත ශාලා දෙක 2011 නොවැම්බර් මස 01 වන දා සිට ක්‍රියාත්මක වන පරිදි සාම්ප්‍රදායික කර්මාන්ත කුඩා ව්‍යවසායීය අමාත්‍යාංශය යටතේ ඇති නෝර්ත් සී සමාගම වෙත පැවරීම මගින් සීනෝර් පදනමෙහි අදායම් මාර්ග අපගේ මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගනයේ නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදන සඳහා පමණක් සීමා වී තිබුණි.

මාළු දැල් කර්මාන්ත ශාලා නෝර්ත් සී සමාගම වෙත පැවරීමෙන් අනතුරුව පසුගිය පාලනාධිකාරිය විසින් බෝට්ටු යාත්‍රාංගනයෙහි සිදු කරනු ලබන නිෂ්පාදන කටයුතු වලට අමතරව වෙරළ ආශ්‍රිත ඉදිකිරීම් ක්ෂේත්‍රයටද අවතීර්ණ වීම මගින් අප සමාගමෙහි ආදායම් මාර්ග පුළුල් කිරීමට කටයුතු කර තිබුණි. එමගින් 2013,2014 සහ 2015 යන වර්ෂයන්වල ඉතා සාර්ථකව ලාභදායී ලෙස සමාගමෙහි මෙහෙයුම් කටයුතු සිදු කිරීමට පසුගිය පාලනාධිකාරිය සමත් වී තිබුණි.

රජයේ විගණකාධිපතිවරයා විසින් ලබා දී ඇති නිර්දේශයන්ට අනුකූලව විෂයභාර අමාත්‍ය ගරු මහින්ද අමරවීර මැතිතුමාගේ උපදෙස් පරිදි මාගේ සභාපතීත්වයෙන් යුත් අධ්‍යක්ෂ මණ්ඩලය 2016 වර්ෂය තුළදී සමාගමෙහි ව්‍යවස්ථාපිත අරමුණු වන ශ්‍රී ලාංකීය ධීවර ක්ෂේත්‍රයට අවශ්‍ය බෝට්ටු සහ අනෙකුත් ෆයිබර්ග්ලාස් ආශ්‍රිත උපාංග නිෂ්පාදනයට පමණක් මෙහෙයුම් කටයුතු සීමා කරමින් ශ්‍රී ලාංකීය ධීවර ක්ෂේත්‍රයෙහි උන්නතියට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමට කටයුතු කරන ලදී.

එමගින් 2016 වර්ෂය තුළ ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ මගපෙන්වීම මත මහා භාණ්ඩාගාරය මගින් ලබා දෙන ලද ප්‍රතිපාදන මගින් සීනෝර් පදනම විසින් පසු අස්වනු නාස්තිය අවම කිරීම සඳහා අඩි 55 ක් දිගැති ධීවර බෝට්ටු අච්චුවක් සහ නවීන ශීතකරණ පද්ධති වලින් සමන්විත අඩි 55 ක් දිගැති ආදර්ශ ධීවර බෝට්ටුවක නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලදී.

නවීන ශීතාගාර පහසුකම් වලින් සහ උපාංග වලින් සමන්විත එම ධීවර යාත්‍රාව නිරීක්ෂණය කරන ලද ශ්‍රී ලාංකීය ධීවර කාර්මිකයින් විසින් රජය මගින් ලබා දෙන ලද 50% ක සහනාධාර ක්‍රමය යටතේ එම මාදිලියේ ධීවර බෝට්ටු පහක නිෂ්පාදන කටයුතු අප සමාගම වෙත ලබාදීම මගින් සමාගමෙහි ආදායම් මාර්ග වැඩි කර ගැනීමට කටයුතු කරන ලදී.

තවද රජය විසින් ලබා දෙන ලද 50% ක සහනාධාර ක්‍රමය මත පෞද්ගලික බෝට්ටු යාත්‍රාංගන වල නිෂ්පාදනය කරනු ලබන බහුදින ධීවර යාත්‍රා පහක නිෂ්පාදන කටයුතු අධීක්ෂණය කිරීම මගින්ද සමාගම වෙත අමතර ආදායමක් ලබා ගැනීමට කටයුතු කරන ලදී.

ධීවර යාත්‍රා සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන කටයුතු වලට අමතරව සීමාසහිත සීනෝර් පදනම සතුව මට්ටක්කුලිය ප්‍රදේශයේ පිහිටා තිබූ වර්ග අඩි 25,000 කින් යුත් ගරා වැටී ගිය ගබඩා සංකීර්ණය අලුත්වැඩියා කිරීමෙන් අනතුරුව නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලින් අනුගමනය කරමින් රජයේ තක්සේරු මුදලට වඩා වැඩි මුදලකට එම ගබඩා සංකීර්ණ අවුරුදු පහක කාල සීමාවක් සඳහා කුලියට ලබා දීමට කටයුතු සැලසුම් කර ඇත.

මෙම සියලු මෙහෙයුම් කටයුතු මගින් වර්ෂය අවසානයේදී රු. 9,264,551.75 ක ලාභාංශයක් ලැබීමට සහ සියලු සේවකයින් සඳහා ප්‍රසාද දීමනා ලබා දීමට කටයුතු කරන ලද බව සඳහන් කරනු ලබන්නේ ඉතා සංතෝෂයෙනි.

අවසාන වශයෙන් 2016 වසරේ දී අත්පත් කරගත් සතුටුදායක තත්වයන් සමග 2017 වසර හා අනතුරුව එළඹෙන වර්ෂවලදී අනාගත අභියෝගයන් දැඩි ආත්ම විශ්වාසයකින් හා ධෛර්යමත්ව භාර ගැනීමට සමාගම සූදානම්ව සිටී.

2016 වර්ෂය තුලදී සමාගම සිය අරමුණු ලඟා කර ගැනීම සඳහා මග පෙන්වීම් සහ සහාය ලබා දුන් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ගරු මහින්ද අමරවීර ඇමතිතුමාටත්, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමියටත් ස්තූතිය පල කරමි. එසේම ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ සේවක මඩුල්ල සමාගමේ නොයෙක් කාරණා සම්බන්ධයෙන් වර්ෂය පුරා දුන් සහයෝගය ඉතා කෘතවේදීව සිහිපත් කරමි. තවද 2016 වර්ෂයේ සමාගමේ අරමුණු මුදුන්පත් කර ගැනීමට සහයෝගය දුන් කළමනාකාර අධ්‍යක්ෂකතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයටත්, සාමාන්‍යාධිකාරිතුමා ඇතුළු සේවක මඩුල්ලේ සාමාජිකයන්ටත් මාගේ ස්තූතිය පල කරමි.

.................................

බී. කේ. ජගත් පෙරේරා

සභාපති

සීමාසහිත සීනෝර් පදනම

# 2016 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

**01. විගණනය කරන ලද ගිණුම්**

2016 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කර ඇත.

**02. මූල්‍ය ප්‍රතිඵල**

වර්ෂයේ ශුද්ධ ලාභය / (අලාභය) පිටු අංක 34 හි සමස්ථ ආදායම පිළිබඳ ප්‍රකාශනයෙහි දක්වා ඇත.

**03. පවත්නා තත්ත්වය**

සමාගමේ පවත්නා තත්ත්වය පිටු අංක 35 හි දක්වා ඇත.

**04. මූලික මෙහෙයුම් කාර්යයන්**

සමාගමේ මූලික මෙහෙයුම් කාර්යයන් පහත පරිදි දැක්වේ.

- ෆයිබර් ග්ලාස් බෝට්ටු හා ඒ ආශ්‍රිත භාණ්ඩ නිපදවීම හා අලෙවිය.
- මාළු දැල් සහ ආනුසාංගික නිෂ්පාදන මිලදී ගැනීම් හා අලෙවිය.
- ධීවර යාත්‍රා සහ නාවික එන්ජින් අලුත්වැඩියාව.
- අඩි 59.5 ක් දිගැති බහුදින ධීවර යාත්‍රා අච්චුවක් නිෂ්පාදනය කිරීම.
- පසු අස්වනු නාස්තිය අවම කිරීම, නවීන ශීතකරණ පහසුකම් වලින් සමන්විත ආදර්ශ බහුදින ධීවර යාත්‍රාවක් නිෂ්පාදනය කිරීම.
- සමාගම සතු මට්ටක්කුලියේ පිහිටි වර්ග අඩි 25000 කින් සමන්විත ගබඩා සංකීර්ණය නවීකරණය කිරීම.
- රජය මගින් ලබාදෙන 50% ක සහනාධාර ක්‍රමය යටතේ අඩි 59.5 ක් දිගැති බෝට්ටු පහක නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම.
- රජය මගින් ලබාදෙන 50% ක සහනාධාර ක්‍රමය යටතේ පෞද්ගලික යාත්‍රාංගනවල නිෂ්පාදනය කරන අඩි 55 ට වැඩි බහුදින ධීවර යාත්‍රා පහක නිෂ්පාදන කටයුතු අධීක්ෂණය කිරීම.

**05. ලාභාංශ**

2016 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලාභාංශ අනුමත කර නොමැත.

**06. සමාගම සමග යෝජිත කොන්ත්‍රාත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරුන්ගේ සබැඳියාව**

2016 වර්ෂය තුල සමාගමේ අධ්‍යක්ෂකවරුන් සමඟ කොන්ත්‍රාත් සබැඳියාවක් නොමැත.

**07. සමාගමේ කොටස් සම්බන්ධයෙන් අධ්‍යක්ෂකවරුන්ගේ සබැඳියාව**

2016 දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වර්ෂය සඳහා අධ්‍යක්ෂවරයෙකු සතු වූ කොටස් නොමැත.

**08. ප්‍රමාණාත්මක කොටස් හිමිකම**

ශේෂපත්‍ර දිනට සමාගමේ නිකුත් කල කොටස් ප්‍රාග්ධනයෙන් 100% මහා භාණ්ඩාගාරයේ ලේකම් සතුව පවතී.

**09. පුණ්‍යායථනයන්ට ආධාර කිරීම්**

2016 වර්ෂය තුලදී සමාගම විසින් කිසිම පුණ්‍යාධාර ආයතනයකට හෝ දේශපාලන කරුණු සඳහා කිසිම දායකත්වයක් සපයා නොමැත.

**10. දේපළ පිරියත හා යන්ත්‍රෝපකරණ වල වෙනස්වීම්**

පිටු අංක 52 හි, උපලේඛනයේ දක්වා ඇති පරිදි දේපළ පිරියත හා යන්ත්‍රොපකරණ සංචලනය වී ඇත.

**11. බැංකු පහසුකම්**

වර්ෂය ආරම්භයේ සිට මේ දක්වා සමාගම සතු බැංකු පහසුකම් අවශ්‍යතා අඛණ්ඩව සපයන සමාගමේ බැංකුකරුවන් ආරක්ෂිත ඇපකර මත තවදුරටත් මෙම පහසුකම කරන බව විශ්වාස කර ඇත.

**12. විගණකවරුන් පත් කිරීම**

19 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ සීමාසහිත සීනෝර් පදනම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණනයට යටත් වේ.

**13. මානව සම්පත**

2016 දෙසැම්බර් 31 වන දිනට සීමාසහිත සීනෝර් පදනමෙහි මුළු සේවක මඩුල්ල පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| 01. ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් | - | 01 |
| 02. කළමනාකරුවන් | - | 07 |
| 03. කණිෂ්ඨ කළමනාකරුවන් | - | 01 |
| 04. කළමනාකාර සහකාරවරුන් | - | 34 |
| 05. ප්‍රාථමික ශිල්පීය හා ශිල්පීය නොවන සේවකයින් | - | 43 |

**14. 2016 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය**

| | | |
|---|---|---|
| බී. කේ. ජගත් පෙරේරා මහතා | - | සභාපති |
| ආර්. එල්. ඊ. ද මෙන්ස් මහතා | - | කළමනාකාර අධ්‍යක්ෂක |
| කේ. ඊ. එස්. එස්. කේ. පෙරේරා මහතා | - | අධ්‍යක්ෂ / මුදල් අමාත්‍යාංශ නියෝජිත |
| සී. ආර්. මුණවීර මහතා | - | අධ්‍යක්ෂ |
| නීතිඥ එල්. එම්. කේ. මුතුකුමාරණ මහතා | - | අධ්‍යක්ෂ |
| එච්. එල්. තිසේරා මහතා | - | අධ්‍යක්ෂ |

**අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි**

අත්සන් කලේ
බී. කේ. ජගත් පෙරේරා

CHAIRMAN
CEYNOR FOUNDATION LTD
90 (335) D. R. WIJEWARDANA MAWATHA,
COLOMBO 10.

අත්සන් කලේ
ආනන්ද සිරිසේන සමාගම
සමාගමේ ලේකම්

Director, Ananda Sirisena & Co. (Pvt.) Ltd. (PV63581)
Registered Secretaries SEC/(2)2008/214

# 2016 වර්ෂය තුළදී ලබාගත් ජයග්‍රහණ

සමාගමෙහි ව්‍යාපාර සහ මෙහෙයුම් කටයුතු 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂය තුළදී සමාගම පිහිටුවීමේ අරමුණු මත පමණක් පදනම් කර සියලු ව්‍යාපාර කටයුතු සිදු කිරීමට කටයුතු කර ඇත. 2015 වර්ෂය තුළ සමාගම විසින් ධීවර යාත්‍රා සහ අනෙකුත් ධීවර ආම්පන්න නිෂ්පාදනය සහ අලෙවිය මගින් ලබාගත් ආදායමට අමතරව වෙරළ ආශ්‍රිත ඉදිකිරීම් ක්ෂේත්‍රයටද අවතීර්ණ වීම මගින් අමතර ආදායමක් උපයාගැනීමට සමත්ව තිබුණි.

නමුත් 2016 වර්ෂය තුළදී මෙහෙයුම් කටයුතු සමාගම පිහිටුවීමෙහි මූලික අරමුණ වන ධීවර බෝට්ටු, විනෝද යාත්‍රා සහ අනෙකුත් ධීවර ආම්පන්න නිෂ්පාදනයට පමණක් සීමා කිරීම මගින් ධීවර ක්ෂේත්‍රයෙහි උන්නතියට දායකවන ඉහළ ගුණාත්මකභාවයකින් යුතු ධීවර යාත්‍රා සහ අනෙකුත් ධීවර ආම්පන්න පමණක් නිෂ්පාදනය කිරීමට කටයුතු කර ඇති අතර එමගින් සමාගමෙහි අපේක්ෂිත ඉලක්කයන් ළඟා කර ගැනීමට සමත් වී ඇත.













මෙම වර්ෂය තුළ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් කරදිය ධීවර කර්මාන්තය මෙන්ම මිරිදිය ධීවර කර්මාන්තය දියුණු කිරීම සහ එමගින් රැකියා විශාල ප්‍රමාණයක් උත්පාදනය කිරීමට සැලසුම් කර තිබුණි. එබැවින් වැව් ආශ්‍රිත මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවර කාර්මිකයින්හට ආධාර ලෙස ඔරු, කොල්ලෑ සහ මත්ස්‍ය ඇසුරුම් පෙට්ටි විශාල ප්‍රමාණයක් ලබා දීමට කටයුතු කර තිබූ බැවින් එම ඇණවුම් සියල්ල නිෂ්පාදනය කිරීම සඳහා ජාතික ජලජීවී වගා සංවර්ධන අධිකාරිය විසින් සීමාසහිත සීනෝර් පදනම වෙත ලබා දීමට කටයුතු කර තිබුණි. ලැබී තිබූ එම ඇණවුම් වලට අනුව ඔරු, කොල්ලෑ සහ මත්ස්‍ය ඇසුරුම් පෙට්ටි විශාල ප්‍රමාණයක් 2016 වර්ෂය තුළදී අප සමාගම විසින් නිෂ්පාදනය කිරීමට සමත් වී ඇත.





ධීවරයින් විසින් නෙලාගන්නා මත්ස්‍ය අස්වැන්න නිසි ලෙස අයිස් යොදා ඇසුරුම් නොකිරීම මගින් නෙලා ගන්නා ලද මත්ස්‍ය අස්වැන්න විශාල ලෙස අපතේ යන බව නාරා ආයතනය මගින් කරන ලද විශේෂ පරීක්ෂණ මගින් හෙලි වී ඇත. එබැවින් අප සමාගම විසින් නෙලා ගන්නා ලද මත්ස්‍ය අස්වැන්න සුරක්ෂිත ලෙස ගබඩා කර හැකි විවිධ ප්‍රමාණයේ මත්ස්‍ය ඇසුරුම් පෙට්ටි නිෂ්පාදනය කිරීම සඳහා 2016 වර්ෂයේ අවතීර්ණ වී ඇත.









කරදිය ධීවර කර්මාන්තයේ යෙදෙන බහුදින ධීවර කාර්මිකයින් දිගු කලක සිට අත්විඳින පසු අස්වනු නාස්තිය සඳහා පිළියම් සෙවීමට ගරු ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ උපදෙස් අනුව සීමාසහිත සීනෝර් පදනම විසින් 2016 වර්ෂය තුළ පරීක්ෂණ කටයුතු ආරම්භ කර තිබුණි.

එහිදී අප විසින් පසු අස්වනු නාස්තිය සඳහා තුඩු දෙන මූලික සාධක ලෙස අපගේ බහුදින ධීවර යාත්‍රා සංචිතයේ ඇති ධීවර යාත්‍රාවල දිග ප්‍රමාණය, මත්ස්‍ය ඇසුරුම් කුටීර වල ප්‍රමාණයන්, ශීතකරණ පහසුකම් සහ නෙලා ගන්නා ලද මත්ස්‍ය අස්වැන්න ඇසුරුම් ක්‍රම වල දුර්වලතාවයන් මූලික වන බව නිරීක්ෂණය කර ඇත.

එබැවින් 2016 වර්ෂයෙහි අවසන් කාර්තුව තුළ සීනෝර් පදනම විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවලියට අනුව කැබිනට් මණ්ඩලය විසින් පසු අස්වනු නාස්තිය අවම කිරීම සඳහා අඩි 55 ක් දිග බෝට්ටු අච්චුවක් සහ එමගින් ආදර්ශ බෝට්ටුවක් නිෂ්පාදනය කර ශ්‍රී ලාංකීය ධීවර ජනතාවගේ නිරීක්ෂණය සඳහා කටයුතු සැලැස්වීමට රු. මි. 44 ක මුදලක් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව හරහා සීනෝර් පදනම වෙත ලබා දීමට කටයුතු කෙරුණි.









එම ව්‍යාපෘතියට සමගාමීව නව තාක්ෂණය හඳුන්වාදීමේ වැය ශීර්ෂය යටතේ ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදෙන ලද අඩි 55 ට වැඩි බෝට්ටු නිෂ්පාදනය සඳහා ලබාදෙන 50% ක සහනාධාර ක්‍රමය යටතේ අප විසින් නිෂ්පාදනය කරන ලද අච්චුව මගින් බෝට්ටු පහක් නිෂ්පාදනය කිරීම සඳහා ඇණවුම් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව සීනෝර් පදනම වෙත ලබා දීමට කටයුතු කර තිබුණි.






ධීවර කර්මාන්තයට අවශ්‍ය යාත්‍රා සහ අනෙකුත් ධීවර ආම්පන්න නිෂ්පාදනයට අමතරව අප සමාගම විසින් සංචාරක කර්මාන්තය තුළ ඉතා ඉහළ ඉල්ලුමක් පවතින සීනෝර් පදනම විසින් පමණක් නිෂ්පාදනය කරනු ලබන අඩි 50 ක් දිගැති මගීන් 100 ට වඩා වැඩි ප්‍රමාණයක් යාත්‍රා කල හැකි ෂම්ම් වර්ගයේ තල්මසුන් නැරඹීමේ යාත්‍රා දෙකක නිෂ්පාදන කටයුතු 2016 වර්ෂය තුළ සාර්ථකව අවසන් කර හිමිකරුවන් වෙත භාරදීමට කටයුතු කර ඇත.





ඉහත සඳහන් කරුණු වලට අමතරව 2016 වර්ෂය තුළ දී අප සමාගම විසින් නිෂ්පාදනය කරන ලද සියලු භාණ්ඩ වල සවිස්තරාත්මක විස්තරයක් පහත වගුවේ දක්වා ඇත.

| අංකය | නිෂ්පාදනය | ප්‍රමාණය |
|---|---|---|
| 01 | ෆයිබර්ග්ලාස් ආරක්ෂක කුටි | 3 |
| 02 | අඩි 19 – 6 බෝට්ටු | 12 |
| 03 | අඩි 18 ½ ඔරු | 692 |
| 04 | බීජ රක්නාගාර සරා | 43 |
| 05 | ෆයිබර්ග්ලාස් පාවෙන ජැටි | 45 |
| 06 | අඩි 15 ½ ඔරු | 598 |
| 07 | ෆයිබර්ග්ලාස් ජංගම ඇඳුම් මාරු කරන කාමර | 6 |
| 08 | ෆයිබර්ග්ලාස් ජංගම අලෙවිසැල් | 2 |
| 09 | කොල්ලෑ 10’- 6’ | 561 |
| 10 | කොල්ලෑ 10’- 2’ | 533 |
| 11 | අඩි 13 ඔරු | 6 |
| 12 | පාපැදි බෝට්ටු | 12 |
| 13 | අඩි 50 තල්මසුන් නැරඹීමේ යාත්‍රා | 2 |
| 14 | ෆයිබර්ග්ලාස් මාළු ඇසුරුම් පෙට්ටි | 334 |
| 15 | අයිස් පෙට්ටි | 34 |
| 16 | අඩි 18 ½ අගුල් | 1 |
| 17 | ෆයිබර්ග්ලාස් ජංගම මගී පුටු | 32 |
| 18 | අඩි 15 ½ අගුල් | 15 |
| 19 | මාළු කැපීමේ මේස | 175 |
| 20 | විනෝද යාත්‍රා | 5 |
| 21 | පාවෙන වේදිකා | 1 |
| **එකතුව** | | **3112** |

# 2016 වර්ෂයේ මූල්‍ය කාර්ය සාධනය

සීමාසහිත සීනෝර් පදනම 2016 මුදල් වර්ෂය අවසානය දක්වා රුපියල් මිලියන 9,264,551.75 ක බදු පසු ලාභයක් උපයමින් ඉතා සාර්ථකව කළමනාකරණය කර ඇත. 2016 වර්ෂයේදී මෙම ලාභය අත්පත් කර ගැනීම සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය මගින් ලබා දෙන ලද ඇණවුම් මෙන්ම අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන මගින් ලබාදෙන ලද ඇණවුම් බෙහෙවින් දායක වී ඇත.

| අනු අංකය | විස්තරය | පිරිවැටුම |
|---|---|---|
| 01 | සමාගමේ නිෂ්පාදන මගින් ලැබූ ආදායම | රු. 137,415,079.98 |
| 02 | අනෙකුත් මෙහෙයුම් ආදායම | රු. 44,541,340.94 |
| 03 | මිලදී ගැනීම් සහ විකිනීම මගින් ලැබූ ආදායම | රු. 10,935,900.18 |
| මුළු ආදායම | | රු. 192,892,321.10 |

වගුව 4

**පසුගිය වසර 5 තුල කැපී පෙනෙන මූල්‍ය තත්ත්වයන්**

| විස්තරය | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|
| මුළු ආදායම | 324.75 | 217.75 | 267.09 | 1,060.63 | 763.4 | 192.892 |
| දළ ලාභය (අලාභය) | 51.22 | 57.19 | 73.83 | 170.56 | 112.92 | 10.935 |
| ශුද්ධ ලාභය (අලාභය) බදු වලට පසු | (16.25) | (7.09) | 0.27 | 89.35 | 61.8 | 9.264 |
| කොටසක ඉපයීම | (4.06) | (1.77) | .070 | 22.34 | 15.45 | 2.32 |
| ස්ථාවර වත්කම් (ශුද්ධ පොත් අගය) | 274.19 | 287.58 | 309.50 | 346.42 | 323.03 | 321.674 |
| ස්ථාවර තැන්පත් | - | - | 1.30 | 1.30 | 1.30 | 1.30 |
| ජංගම වත්කම් | 180.91 | 191.63 | 186.58 | 445.25 | 263.8 | 310.974 |
| ජංගම වගකීම් | 218.67 | 227.51 | 225.93 | 431.48 | 175.1 | 190.223 |
| ජංගම නොවන වගකීම් | 71.64 | 28.50 | 46.93 | 41.25 | 30.9 | 52.398 |
| කොටස් ප්‍රාග්ධනය | 40.00 | 40.00 | 40.00 | 40.00 | 40.00 | 40.00 |
| අනෙකුත් සංචිත සමග ප්‍රාග්ධනය | 178.09 | 231.55 | 231.55 | 320.91 | 382.7 | 391.988 |

# අනාගත සැලසුම්

- සීමාසහිත සීනෝර් පදනම විසින් නිෂ්පාදනය කරන ලද අඩි 59.5 ක් දිගැති නවීන ශීතාගාර පහසුකම් වලින් සමන්විත බහුදින ධීවර යාත්‍රාව දේශීය සහ විදේශීයව ප්‍රචලිත කිරීම මගින් සමාගමෙහි නිෂ්පාදන සහ අලෙවි ඉලක්කයන් සපුරා ගැනීමට සැලසුම් සකස් කර ඇති අතර මෙම නවීන ධීවර යාත්‍රාව වෙළඳපොළට හඳුන්වාදීම මගින් ධීවර ක්ෂේත්‍රයෙහි දැනට අත්විඳින 40% ක් පමණ වන පසු අස්වනු නාස්තිය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුකර ගැනීමට සැලසුම් කර ඇත.



- අප විසින් නිෂ්පාදනය කරනු ලබන අඩි 50 ක් දිගැති තල්මසුන් නැරඹීමේ යාත්‍රා සඳහා මිරිස්ස ප්‍රදේශයේ ඉහළ ඉල්ලුමක් පවතින බැවින් එම යාත්‍රාවන්හි නිෂ්පාදන කටයුතු කාර්යක්ෂමව හා උසස් ප්‍රමිතියකින් යුතුව නව මුහුණුවරකින් වෙළඳපොලට හඳුන්වාදීම මගින් දේශීය සහ විදේශීය සංචාරකයින්ගේ ඉහළ ආකර්ෂනය ලබා ගැනීමටත් එමගින් සීනෝර් පදනමෙහි අදායම වැඩිකර ගැනීමටත් සැලසුම් කර ඇත.



- සීමාසහිත සීනෝර් පදනම සතු දැනට නවීකරණ කටයුතු අවසන් කර ඇති වර්ග අඩි 25,000 ක් වන ගබඩා සංකීර්ණය නිවැරදි ප්‍රසම්පාදන ක්‍රියාවලීන් අනුගමනය කර රජයේ තක්සේරු මුදලට වඩා වැඩි මිලකට කුලී පදනම මත ලබා දීමට සැලසුම් කර ඇත.

- සීමාසහිත සීනෝර් පදනම සතුව පැවැති යුද්ධයෙන් විනාශයට පත් වූ කරෛනගර් බෝට්ටු යාත්‍රාංගනයෙහි ඉදිකිරීම් කටයුතු මේ වන විට අවසාන අදියරට පැමිණ ඇත. ශක්‍යතා අධ්‍යයන වාර්තාව ලබා ගැනීමෙන් අනතුරුව එහි මෙහෙයුම් කටයුතු සීනෝර් පදනම මගින් සිදු කිරීමට හෝ පෞද්ගලික අංශයක් සමග ඒකාබද්ධව සිදු කිරීමට සැලසුම් කර ඇත.



මගේ අංකය / எனது இல. / My No. } එෆ්එල්එස්/බී/සීඑන්එෆ්එල්/16/71

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 ඔක්තෝබර් 12 දින

සභාපති

සී/ස සීනෝර් පදනම

සී/ස සීනොර් පදනමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

---

යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නියමිත ඉහත සඳහන් වාර්තාව මේ සමඟ එවා ඇත.

එස්.රණතුංග

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

Swarna Ranathunga
Assistant Auditor General
Auditor General's Department

**සීමාසහිත සීනෝර් පදනමේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව**

---

සී/ස සීනෝර් පදනමේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යාවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 154 (6) ව්‍යාවස්ථාව ප්‍රකාර මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළයුතුයැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට ආදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස පදනමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් පදනමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක්

ප්‍රකාශකිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

### (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

#### (i) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

* ප්‍රමිතයේ 79 (බී) ඡේදය ප්‍රකාරව ස්කන්ධය තුළ දක්වා ඇති සංචිතවල ස්වභාවය හා අරමුණු හෙළිදරව් කළයුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

* ප්‍රමිතයේ 117 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන අවබෝධ කරගැනීම සඳහා සැලකියයුතු වැදගත්කමක් දක්වන ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කළයුතු වුවත් මූල්‍ය උපකරණවලට අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

#### (ii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12

ප්‍රමිතයේ 79,80 සහ 81 වැනි ඡේද ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ බදු වියදමට අදාල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

#### (iii) ගිණුම්කරණ ප්‍රමිත 16

අස්ථිත්වය විසින් රු.260,559,448 ක ප්‍රත්‍යාගණන සංචිතයක් මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගෙන තිබුණද, ප්‍රමිතියේ 77 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තුළ පහත දැක්වෙන හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

ප්‍රත්‍යාගණනය ක්‍රියාත්මක වන දිනය
ස්වාධීන තක්සේරුකරුවකු යොදාගත්තේ ද යන වග
වත්කම්වල සාධාරණ වටිනාකම් ඇස්තමේන්තු කිරීමේ දී භාවිතා කළ ක්‍රම සහ වැදගත් උපකල්පනයන්

**(iv) ගිණුම්කරණ ප්‍රමිත 19**

ප්‍රමිතියේ 57 ඡේදය ප්‍රකාරව අර්ථ දක්වන ලද ප්‍රතිලාභ වගකීම පුරෝකථනය කල ඒකක බැර ක්‍රමය මඟින් විශ්වාසදායී ඇස්තමේන්තුවක් කළ යුතුය. එහෙත් අස්ථිත්වය විසින් ගිණුම්කරණ ප්‍රමිතියට පටහැනි ලෙස පසුගිය මූල්‍ය වර්ෂයේ අවසාන මාසයේ ලබාගත් වැටුපෙන් භාගයක් එක් එක් නිලධාරියා සම්පූර්ණ කරන ලද වර්ෂ ගණනින් ගුණ කර ගණනය කර තිබුණි.

**(v) ගිණුම්කරණ ප්‍රමිත 24**

ප්‍රමිතියේ 17 ඡේදය ප්‍රකාරව අස්ථිත්වය විසින් ප්‍රධාන කළමනාකරණ පුද්ගල ප්‍රතිලාභ හෙළිදරව් කර නොතිබුණි.

**(vi) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිත 07**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

ප්‍රමිතයේ 08 ඡේදය ප්‍රකාරව මූල්‍ය වත්කම් හා බැඳීම්වල ධාරණඅගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හෝ සටහන්වල හෙළිදරව් කළයුතු වුවත්, එසේ හෙළිදරව් කර නොතිබුණි.

ප්‍රමිතයේ 31 සහ 33 ඡේද ප්‍රකාරව වාර්තා කරන කාල සීමාව අවසානයේ මූල්‍ය උපකරණ සම්බන්ධයෙන් අස්ථිත්වයේ නිරාවරණය වන්නා වූ අවදානම් ස්වභාවය හා එහි ප්‍රමාණය ඇගයීම සඳහා අවශ්‍ය තොරතුරු හෙළිදරව් කර නොතිබුණි.

**(ආ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 23 හි 08 වන ඡේදය ප්‍රකාරව සුදුසුකම් ලබන වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිපදවීම හේතුවන්නා වූ ණය ගැණුම් පිරිවැය එකී වත්කම් පිරිවැයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කළ යුතු අතර අනෙකුත් ණය ගැණුම් පිරිවැය එකී කාල සීමාව තුළ වියදමක් ලෙස සැලකිය යුතුය. එහෙත්, පදනම විසින් ඊට පටහැනි ලෙස ණය ගැණුම් පිරිවැය අස්ථිත්වයෙහි වියදමක් ලෙස හඳුනාගන්නා බවට ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන තිබුණි.

(ඇ) ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2008 පෙබරවාරි 14 දින සීමාසහිත සීනෝර් පදනම බංගලාදේශයේ ආයෝජකයකු සමඟ එළඹී ගිවිසුමකට අනුව ආරම්භකර තිබුණු ශ්‍රී බංගලාස් බෝට්ටු ව්‍යාපාරය ලාභ නොලබන තත්ත්වයේ පැවති බැවින් 2016 ජූලි 28 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත ගිවිසුම අවසන් කර තිබුණි. එහෙත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 අනුව 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු.1,961,850 ක් වූ ආයෝජනයට අදාළව හානිකරණය (Impairment of investment) සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ii) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ ට්‍රැක්ටර් ටේලර් හා මෝටර් රථ සඳහා සමාලෝචිත වර්ෂයේදී තවදුරටත් පිළිවෙලින් රු.166,695 ක හා රු.1,867,241 ක ක්ෂය ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වත්කම්වල ශුද්ධ අගය සහ ලාභය රු.2,033,936 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(iii) 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු.125,303,319 ක ණයගැති ශේෂය තුල 2004, 2011, හා 2015 යන වර්ෂවල සිටඅයනොවී පැවත එන එකතුව රු.22,203,074 ක් වූ ණයගැති ශේෂ පැවතියද බොල් හා අඩමාණ ණය සඳහා රු.6,392,490 ක වෙන්කිරීම් පමණක් සිදුකර තිබූ අතර එම වෙන්කිරීම් ප්‍රමාණය ප්‍රමාණවත් නොවූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඈ) පැහැදිලි නොකළ වෙනස්කම්

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016 දෙසැම්බර් 31 දිනට සීනෝර් පදනමේ මූල්‍ය ප්‍රකාශන අනුව නෝර්ත් සී සමාගමෙන් ලැබිය යුතු හා එම සමාගමට ගෙවිය යුතු ලෙස පිළිවෙලින් රු.26,294,662 ක් හා රු.18,294,909 ක් දක්වා තිබුණද සී නෝර්ත් සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂ පිළිවෙලින් රු.24,978,402 ක්රු.24,846,086 ක් වූයෙන් පිළිවෙලින් රු. 1,316,260 ක හා රු.6,551,177 ක පැහැදිලි නොකළ වෙනස්කම් පැවතුණි.

(ii) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ස්ථාවර වත්කම් වටිනාකම රු.20,505,436 ක් වුවද ස්ථාවර වත්කම් ලේඛනය අනුව එම වටිනාකම රු.29,774,369 ක් වූයෙන් රු.9,269,203ක වෙනසක් නිරීක්ෂණය විය.

(iii) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ පිරිවැටුම රු.205,502,518 ක් වුවද ජාතිය ගොඩනැගීමේ බදු ගණනයේදී ගෙන තිබූ පිරිවැටුම හා එකතු කල අගය මත බදු ගෙවීම සඳහා යොදා ගනු ලැබූ පිරිවැටුම සමඟ සැසඳීමේදී පිළිවෙලින් රු.1,070,507 ක හා රු.3,069,618 ක වෙනසක් නිරීක්ෂණය විය.

**(ඉ) විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂ යටතේ දක්වා ඇති එකතු කළ අගය මත බදු රු.1,458,292 කින්, එකතු කළ අගය මත බදු රු.11,719,949 ක් වූ හර ශේෂය, ආර්ථික සේවා ගාස්තු රු.138,205 ක් වූ හර ශේෂය සහ අනෙකුත් ලැබිය යුතු ශේෂවල ඇතුලත් ඉදිරියට ගෙවූ ආර්ථික සේවා බදු රු.2,466,894 ක් සඳහා ශේෂ සනාථන ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සීනෝර් පදනම සතුව පැවති ලුණුවිල හා වීරවිල කර්මාන්තශාලා දෙක නෝර්ත් සී ලිමිටඩ් වෙත පැවරීම සම්බන්ධයෙන් 2010 නොවැම්බර් 02 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව, වත්කම්වල පැවරුම් වටිනාකම ගණනය කිරීමේ වාර්තාව හෝ රජයේ තක්සේරු වාර්තාව විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සීමාසහිත සීනෝර් පදනමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) * විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත් මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන ඇති බවත්,

* සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි දැක්වෙන අවශ්‍යතාවන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවති එකතුව රු.9,202,662 ක් වූ වෙනත් ලැබිය යුතු ශේෂ 05 ක් සමාලෝචිත වර්ෂය තුළදී නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 දෙසැම්බර් 31 දිනට පැවති රු.138,912,830 ක් වූ වෙනත් ගෙවිය යුතු ශේෂයෙහි ඇතුළත්ව තිබුණු විකුණුම් අත්තිකාරම රු.113,123,958 ක් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන ණයගැති ශේෂය තුළ ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය නමින් වූ රු.230,012 ක සෘණ ශේෂයක් මාස 03 කට වැඩි කාලයක සිට පැවති අතර එය නිරවුල් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ඈ) 2016 දෙසැම්බර් 31 දිනට වසරකට වැඩි කාලයක් ඉක්මවා තිබුණුරු.6,477,608 ක් වූ අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු.9,264,551ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.61,814,529 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.52,549,978 ක පිරිහීමක් විය. විකුණුම් පිරිවැය රු.54,192,681 කින් ඉහල යාම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2007 අංක 07 දරන සමාගම් පනතින් පාලනය වන සී/ස සීනෝර් පදනමේ සාංගමික සංස්ථාපත්‍රය ප්‍රකාරව ප්‍රධාන අරමුණු පහත පරිදි විය.

(අ) ට්‍රෝලර්, බෝට්ටු, ධීවර යාත්‍රා, නාවික මෝටර් හා වෙනත් නාවික උපකරණ අලුත්වැඩියා කිරීම හා පිළිසකර කිරීම සඳහා වැඩපොළවල් ගොඩනැගීම, නිෂ්පාදනය, විකිණීම හා මෙහෙයුම් කිරීමේ ව්‍යාපාර සිදු කිරීම.

(ආ) අයිස් සහ නාවික නිෂ්පාදන, නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාර සිදුකිරීම හා එම නිෂ්පාදන සැකසුම් කිරීම, ඇසුරුම් කිරීම, අලෙවි කිරීම හා අපනයනය කිරීම.

(ඇ) මාළු දැල් නිෂ්පාදනය කිරීම, විකිණීම හා අනුශාංගික ධීවර ආම්පන්න ශ්‍රී ලංකාවේ හෝ විදේශයක නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාර සිදුකිරීම.

(ඈ) පදනමේ කාර්යයන්වලට අදාලව වෙළෙඳ නියෝජිතයෙකු, විකුණුම් නියෝජිතයෙකු හෝ නිෂ්පාදකයෙකු ලෙස කටයුතු කිරීම.

ඉහත සඳහන් අරමුණු ඉටුකරගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පදනමේ ප්‍රධාන අරමුණු යටතේ දක්වා තිබූ අයිස් නිෂ්පාදනය හා ඒ ආශ්‍රිත කටයුතු ඉටුකිරීම සහ ධීවර දැල් නිෂ්පාදනය, වර්තමානයේ අරමුණුවලින් ඉවත්කර ඇතත් ඒ අනුව සාංගමික සංස්ථාපත්‍රය සංශෝධනය කර ගැනීමට පදනමකටයුතු සිදුකර නොතිබුණි.

(ii) වෙළඳ නියෝජිතයෙකු ලෙස පදනමේ කාර්යය පුළුල් කිරීම සඳහා සිල්ලර වෙළෙඳසැල් 300 ක් ස්ථාපිත කිරීමට 2016 වර්ෂයේ සංයුක්ත සැලැස්ම මගින් සැලසුම් කර තිබුණ ද එම කාර්යය ඉටුකර නොතිබූ අතර 2017 නොවැම්බර් වනවිට සියලු සිල්ලර වෙළෙඳසැල්වල මෙහෙයුම් කටයුතු නවතා ඇති බව නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සීමාසහිත සීනෝර් පදනම සතුව පැවති මත්තුමගල පිහිටි වාහන අළුත්වැඩියා වැඩපොළ 2016 අගෝස්තු 02 දින සිට වසර 15 ක කාලයක් සඳහා පෞද්ගලික සමාගමකට බදු දීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ විය.

(i) ඉහත බදු ගිවිසුම අනුව බදුගැණුම්කරු විසින් පළමු වසර 5 තුළ මාසයකට රු.100,000 ක්ද දෙවන වසර 5 තුළ මසකටරු.150,000 ක්ද තෙවන වසර 5 තුළ මසකට රු.250,000 ක් ද වශයෙන් අවමයකට යටත්ව වාර්ෂික පිරිවැටුමෙන් සියයට 3 ක ගාස්තුවක් පදනමට ගෙවිය යුතු විය. මාසයකට රු. 150,000 බැගින් රු.1,800,000 ක ගාස්තුවක් පළමු වර්ෂය සඳහා අයකර තිබුණු අතර එම අයකරගත් ආදායමේ නිරවද්‍යතාවය සනාථ කර ගැනීම සඳහා බදුගැණුම්කාර සමාගමේ විගණිත මූල්‍ය ප්‍රකාශන පදනම විසින් පරික්ෂා කර නොතිබුණි.

(ii) මත්තුමගල වාහන අලුත්වැඩියා වැඩපොළ පිහිටි ඉඩමේ නීත්‍යානුකූල හිමිකාරත්වය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය හිමිකම් ඔප්පු හෝ වෙනත් සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(iii) ඉහත බදු ගිවිසුමේ 2 (ඩී) හා සී වගන්ති ප්‍රකාරව, වැඩ බිමෙහි සේවයේ යෙදී සිටි සේවකයින් එය බදු දෙන අවස්ථාවේ බදු ගැණුම්කාර සමාගමටඅන්තර්ග්‍රහණය කරනු ලබන බවත් එම සේවකයින් හට ගෙවනු ලබන වැටුප් එම සමාගම විසින් සීනෝර් පදනමට ප්‍රතිපූර්ණය කළයුතු බවත් දක්වා තිබුණි. එසේ වුවද 2016 ජුලි 22 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව එම සේවකයින් අන්තර්ග්‍රහණය කර නොමැති බව අනාවරණය විය.

(iv) බදු ගැනුම්කරු විසින් සිය ව්‍යාපාරික නාමය වෙනස්කර තිබුණද බදු ගිවිසුම ඒ අනුව සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පදනමට අයත් කොළඹ 10 ඩී.ආර්. විජේවර්ධන මාවතේ පිහිටි රූඩ් 2 යි පර්චස් 18.24 ක ඉඩම සීනෝර් පෞද්ගලික සමාගමට 1998 ජුලි 04 දින මාසයකට රු. 40,000ක් බැගින් වසර 20 ක් සඳහා බදු දී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) බදු ගිවිසුම අනුව ඉහත බදු මුදලට අමතරව ව්‍යාපාරයේ ගොඩනැගිලි ක්ෂයවීම් අඩු කිරීමට පෙර ශුද්ධ ලාභයෙන් සියයට 40 ක කොටසක් සීනෝර් සමාගමට ගෙවිය යුතු වුවද, 1998 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වාම එම කොටස ලැබී නොතිබුණු අතර, අදාල සමාගමේ විගණිත ගිණුම් සීනෝර් පදනම විසින් පරීක්ෂා කර ද නොතිබුණි.

(ii) ගිවිසුමේ 11 වගන්තිය ප්‍රකාරව කිසියම් අවුරුදු 5 ක කාල සීමාවක් තුළ බදු ගැනුම්කාර ව්‍යාපාරය උපයන ශුද්ධ ලාභය සාධාරණ අයුරින් ප්‍රමාණවත් නොවන්නේ නම් බදුගැණුම්කරුගේ අනුමැතියකින් තොරව බදු දීමනාකරුට ගිවිසුම අවලංගු කිරීමට හැකි වුවද ගිවිසුම අනුව ලැබිය යුතුලාභ කොටස නොලැබීම මත ගිවිසුම අවලංගු කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) ගිවිසුමේ 12 වගන්තිය ප්‍රකාරව ගිවිසුම අවලංගු කිරීමෙන් පසු ඉතිරි වී ඇති එක් එක් වර්ෂය සඳහා රු.250,000 ක මුදලක් බදු දීමනාකරු විසින් බදුගැණුම්කරුට ගෙවිය යුතු බවට ගිවිසුම්ගතව තිබුණු අතර ගිවිසුමේ 11 වගන්තියේ ප්‍රතිපාදනවලට පටහැනිව ඇතිකරගෙන තිබුණු එම අවාසිදායක වගන්තිය සම්බන්ධයෙන් ගිවිසුමට එළඹුණු අවස්ථාවේ දී කළමනාකාරිත්වය විසින් සලකා බලා නොතිබුණි.

(iv) ඉහත බදු ගිවිසුමේ කාලය 2018 ජූලි 04 දිනෙන් අවසන් වන අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සහ අමාත්‍ය මණ්ඩලයේ හා නීතිපති දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට යටත්ව එදින සිට අවුරුදු 30 ක කාලයක් සඳහා වත්මන් බදුකරු වෙත නැවත වරක් බදුදීම සඳහා පදනමේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි. ඒ අනුව 2016 සැප්තැම්බර් 20 දින තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තක්සේරුගත වාර්ෂික බදුකුලී වටිනාකම රු.39,300,000 ක් වූ අතර එම වටිනාකමට බදුගැනීමට වර්තමාන බදු ගැනුම්කරු අකමැති වීම හේතුවෙන් 2016 නොවැම්බර් 29 දින ඉඩමෙහි වසර 30 ක බදු කුලී වටිනාකම රු. 604,000,000 ක් ලෙස නැවත තක්සේරු කර තිබුණි. එසේ දෙවනවර ලබාගත් තක්සේරුව අනුව ඉඩමෙහි වාර්ෂික බදු කුලී වටිනාකම රු.20,133,333 ක් වී තිබුණු අතර පළමු තක්සේරුවට වඩා දෙවන තක්සේරුව රු.19,166,667 කින් අඩුවීමට හේතු විගණනයට පැහැදිලි නොවිය.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සී/ස සීනෝර් පදනම සතු ජංගම වැඩපොළවල් 2 ක් හා වටිනාකමක් දක්වා නොමැති ආයුධ හා වෙනත් උපකරණ අයිතම 105 ක් පෞද්ගලික සමාගමකට 2006 අගෝස්තු 17 දින බදු දී තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) බදුගිවිසුමේ 6 (ඇ) වගන්තිය ප්‍රකාරව සෑම ජංගම වැඩපොළක් සඳහාම සිදුවන අලාභහානි වෙනුවෙන් බදුගැණුම්කරු විසින් රු.මිලියන 2.5 ක රක්ෂණ ආවරණයක් ලබාගත යුතු වුවද එවැනි රක්ෂණ ආවරණයක් ලබාගැනීමට කටයුතු කර නොතිබුණු අතර කළමනාකරණයේ අවධානයද ඒ සඳහා යොමුකර තිබුණි.

(ii) බදුගැණුම්කාර සමාගමට වැඩපොළවල් පැවරීමේදී ආයුධ සහ වෙනත් උපකරණ ඒකක 105 ක් භාරදී තිබුණද ඒ සම්බන්ධයෙන් භෞතික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

**4.4 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

---------------------------------

**(අ) ශ්‍රී බංගලාස් බෝට්ටු නිෂ්පාදන සමාගමේ ආයෝජනය**

----------------------------------------------------------

2007 පෙබරවාරි 22 දිනැති අංක අමප/07/0198/351/001 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සීමාසහිත සීනෝර් සමාගම විසින් බෝට්ටු නිෂ්පාදන බද්ධ ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා බංගලාදේශයේ එලයිඩ් ඇග්‍රෝ ඉන්ඩස්ට්‍රීස් සමාගම සමග 2008 පෙබරවාරි 18 දින ගිවිසුමකට එළඹ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ගිවිසුම අනුව ව්‍යාපාරයේ බද්ධ හවුල්කරු සම්බන්ධයෙන් බැංකු සුරක්ෂණයක් ලබාගත යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) ගිවිසුම අනුව පදනමේ ආයෝජනය එ.ජ.ඩො. 80,000 ක් වුවද,පදනම විසින් එ.ජ.ඩො.101,265 ක් ආයෝජනය කර තිබීම හේතුවෙන් එ.ජ.ඩො.21,265 ක් වැඩිපුර ආයෝජනය කර තිබුණි. ආයෝජනය වෙනුවෙන් 2017 වර්ෂය දක්වා කිසිදු ප්‍රතිලාභයක් සීනෝර් පදනමට ලැබී නොතිබුණි.

(iii) 2016 ජුලි 28 දිනැති අංක 310 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මගින් ව්‍යාපෘතිය අවසන් කිරීමට අනුමැතිය ලබාදී තිබුණද මෙම වාර්තාවේ දින වන විටත් ව්‍යාපෘතිය අවසන් කිරීමට කටයුතු කර නොතිබුණු අතර මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.මිලියන 1,961,850 ක අගයක් ආයෝජන යටතේ දක්වා තිබුණි.

(ආ) **දැල් නිෂ්පාදන කම්හල් රාජ්‍ය සමාගමක් වෙත පැවරීම**

2010 නොවැම්බර් 18 දිනැති අංක අමප/10/2658/418/015 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව සීමා සහිත සීනෝර් පදනම සතුව පැවති ලුණුවිල හා වීරවිල දැල් කම්හල් දෙක සීමා සහිත නොර්ත් සී ලිමිඩට් ආයතනය වෙත පවරා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් කම්හල් පවරාදීම හා පවරා ගැනීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ කිරීමට පෙර ඒ පිළිබඳ විද්‍යානුකූල පදනමක් මත වෙළඳපල සමීක්ෂණයක්, ආයෝජන ඇගයීමක් හෝ ශක්‍යතා අධ්‍යනයක් සිදුකර නොතිබුණි.

(ii) ශ්‍රී ලංකාව තුල නයිලෝන් මාළු දැල් නිෂ්පාදනය සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රමිති සහතිකය (ISO 9001,2000) හිමි එකම ආයතනය වන සීමාසහිත සීනෝර් පදනම 2010 වර්ෂයේ දී මෙම කම්හල් දෙක මගින් දැල් කිලෝ ග්‍රෑම් 148,186 ක් නිෂ්පාදනය කරතිබූ අතර දැල් අලෙවියෙන් රු. මිලියන 215.6 ක ආදායමක් උපයාගෙන තිබුණි. එය ආයතනයේ සමස්ත ආදායමෙන් සියයට 64 ක් වූ අතර පැවරුම් අවස්ථාව වන විට දැල් කි.ග්‍රෑ.66,560.69 සැපයීම සඳහා පදනම විසින් ඇනවුම් භාරගෙන තිබුණි. එසේ තිබියදී දැල් කම්හල් දෙක වෙනත් ආයතනයකට පැවරීම තුලින් ධීවර ක්ෂේත්‍රයට හා ආයතනයට අහිතකර බලපෑමක් ඇතිකර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iii) කර්මාන්ත ශාලා දෙක නොර්ත් සී ආයතනයට පැවරීම සිදු කරන අවස්ථාව වන විට පදනම විසින් රු.14,676,642 ක් වටිනා අමුද්‍රව්‍ය නොර්ත් සී ලිමිටඩ් වෙත භාර දී තිබුණද මෙම අමුද්‍රව්‍ය තොගවල වටිනාකම තොග පැවරුම් අවස්ථාවේ ගැනුම් ප්‍රතිෂ්ඨාවට සලකා බලා නොතිබුණි.

(iv) 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව සී / ස සීනෝර් පදනම සතුව පැවති රු.51,688,575 ක පොත් අගය ඇති ස්ථාවර වත්කම් හා රු.18,137,565ක පොත් අගය ඇති කල්බදු වත්කම් පැවරීමේ දී ප්‍රත්‍යාගණන අලාභය ලෙස රු.37,488,524 ක් අඩුකර තිබුණි. 2011 මාර්තු 11 වන දින සභාපති විසින් අමාත්‍යාංශ ලේකම්ට යොමු කරන ලද වාර්තාව අනුව පවරන ලද වත්කම්වල වෙළඳපල අගය රු.77,800,000 ක් බව දක්වා තිබුණි. 2011 විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව ශුද්ධ පොත් අගය රු. 69,826,140 ක් වූ වත්කම්වල වෙළඳපොළ අගය රු. 77,800,000 ක් ලෙස දක්වා තිබියදී රු. 37,488,524 ක් වූ ප්‍රත්‍යාගණන අලාභයක් හඳුනා ගැනීම විගණනයේ දී ගැටළු සහගත විය. කෙසේ වුවද ආයතනය සතුව පැවති වත්කම් නිසි පරිදි අගය කොට පවරා නොතිබුණි.

## 4.5 අනාර්ථික ගනුදෙනු

### (අ) පදනම සතු එක්ස්කැවේටර් යන්ත්‍රය කුලියට දීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2016 සැප්තැම්බර් 10 දිනසිට 2017 මාර්තු 11 දින දක්වා මාස 06 ක් සඳහා වැඩ කරන දිනක පැයක් සඳහා රු.11,000 බැගින් හා දිනකට අවම වශයෙන් රු.44,000 ක් බැගින් ගෙවීමේ පදනම මතපදනම සතු එක්ස්කැවේටර් යන්ත්‍රය ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත කුලියට දීම සඳහා කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. එසේ වුවද, ගිවිසුම් ප්‍රකාරව එම සංස්ථාව වෙතින් අයවිය යුතු කිසිදු මුදලක් අයකර ගැනීමට පදනම විසින් කටයුතු කර නොතිබුණි.

(ii) ධීවර වරාය නීතිගත සංස්ථාව විසින් මෙම යන්ත්‍රය 2016 නොවැම්බර් 08 දින සිට බාහිර ආයතනයකට බදු පදනම මත ලබා දී තිබූ අතර වැඩ කරන පැයක් සඳහා රු.3,500 ක් ද ලිහිසි තෙල් හා නඩත්තු කටයුතු සඳහා මසකට රු.50,000 ක් ද ඇප තැන්පතු වශයෙන් රු.500,000 ක් ද සංස්ථාව වෙත ගෙවන ලෙස එකඟ වී තිබුණද ධීවර වරාය නීතිගත සංස්ථාව සීනෝර් පදනම සමඟ එළඹී ගිවිසුම අනුව උප බදු දීම සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(iii) 2014 ඔක්තෝබර් 27 දින රු.මි.40 කට මිලදී ගෙන තිබුණු මෙම යන්ත්‍රය වසර තුනක් නොඉක්මවන කාලයකදී වටිනාකම තක්සේරු කිරීමකින් තොරව ධීවර වරාය නීතිගත සංස්ථාව වෙත රු.මි.28 කට විකුණා තිබුණි.

**4.6 හඳුනාගන්නා ලද පාඩු**

උතුරු පළාත් සෞඛ්‍ය සේවා අමාත්‍යාංශය 2015 වර්ෂයේ දී ඉදිරිපත් කළ ඇණවුමක් මත, ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව සීමාසහිත සිනෝර් පදනම විසින් රු.4,515,923 ක වියදමක් දරා ගිලන් යාත්‍රාවක් (AMBULANCE BOAT) නිෂ්පාදනය කර තිබුණි. නියමිත පිරිවිතරයන්ට අනුකූල බවට තාක්ෂණික ඇගයීම් කමිටුවක් විසින් තහවුරු කර ගැනීමකින් තොරව යාත්‍රාව සඳහා රු.1,130,000 ක් වටිනා බෝට්ටු එන්ජිමක් මිලදී ගෙනසවිකර තිබුණු අතර එම එන්ජිම අධික ලෙස රත්වීම හේතුවෙන් ගැණුම්කරු විසින් යාත්‍රාව මිලදී ගැනීම ප්‍රතික්ෂේප කර තිබුණි. ඒ අනුව යාත්‍රාව හා එන්ජිම සඳහා දරන ලද එකතුව රු. 4,515,923 ක් පදනමට පාඩුවක් වී තිබුණි.

**4.7 කාර්ය මණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 135ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 86 ක් වීමෙන් පුරප්පාඩු 50 ක් හා අතිරික්තය 01 ක් විය.

(ආ) 2012 අප්‍රේල් 26 දින සිට හා 2016 දෙසැම්බර් 01 දින සිට පුරප්පාඩුව පැවති සහකාර කළමනාකරු(මෙහෙයුම්) තනතුර හා මානව සම්පත් කළමනාකාර තනතුර වාර්තාවේ දිනය දක්වා පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) අනුමත කාර්ය මණ්ඩලය තුළ වැඩහල් කළමනාකරු තනතුර පැවතිය ද සමාගමට අයත් මත්තුමගල වැඩහල වෙනත් ආයතනයකට බදු දීම නිසා ආයතනය සතුව වැඩහලක් නොමැති වීම හේතුවෙන් එම නිලධාරියාට ප්‍රවාහන කළමනාකරුගේ රාජකාරි පවරා තිබුණුද ප්‍රවාහන කළමනාකරු තනතුරක් අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුළත්ව නොතිබුණි.

**5. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1. වගන්තිය ප්‍රකාරව කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන මාස 06 ක ප්‍රමාදයකින්පසු 2017 සැප්තැම්බර් 08 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 5.2 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පදනම විසින් 2013 - 2017 කාල පරිච්ඡේදයට අදාලව පිළියෙල කර තිබූ සංයුක්ත සැලැස්ම කාලානුරූපව සමාලෝචනය කර යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී එන්ජින් අමතර කොටස්, ධීවර ආම්පන්න නිපදවීම හා යාත්‍රා අළුත්වැඩියා කටයුතු වලින් රු. මිලියන 87 ක් උපයා ගැනීමට සැලසුම් කර තිබුණද එම කටයුතු කිසිවක් ඉටුකර නොතිබුණි.

## 5.3 ක්‍රියාකාරි සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පදනමේ ක්‍රියාකාරි සැලැස්ම සංයුක්ත සැලැස්මේ අරමුණුවලට අනුරූපව සකස් කර නොතිබුණි.

(ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරි වර්ෂය සඳහා අනුමත කරන ලද ක්‍රියාකාරි සැලැස්මේ පිටපතක් මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර විගණකාධිපති වෙත යොමු කළයුතු වුවත්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016 වර්ෂය සඳහා වූ ක්‍රියාකාරි සැලැස්ම විගණනයට ඉදිරිපත් කර තිබුණේ 2016 ඔක්තෝබර් 19 දිනදීය.

## 5.4 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණන අංශය සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුමත කරවාගෙන නොතිබුණු අතර අංශ ප්‍රධානි සහ තවත් එක් නිලධාරියෙකුගෙන් පමණක් එම අංශය සමන්විත වීම අභ්‍යන්තර විගණන අංශයේ අපේක්ෂිත කාර්යසාධනය හා එම අංශය පිහිටුවීමේ මූලික පරමාර්ථ ඉටුකර ගැනීමට බාධාවක්ව පැවතුණි.

(ආ) 2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා අනුමත කරන ලද අභ්‍යන්තර විගණන වැඩසටහන විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළයුතු වුවත්, 2016 වර්ෂයට අදාල අභ්‍යන්තර විගණන වාර්තා මෙම වාර්තාවේ දිනය වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5.5 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව සෑම මිලදී ගැනීමක් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ සිදුකරන ලදරු.8,256,101 ක් වටිනා අමුද්‍රව්‍ය සහ රු.1,376,413 ක් වටිනා සී.සී.ටී.වී කැමරා මිලදී ගැනීමේදී පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමකට ද එළඹී නොතිබුණි.

## 5.6 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාරචක්‍රලේඛයේ 5.2.4 වගන්තියටඅනුවආයතනයක කෙටුම්පත් අයවැය ලේඛනය මූල්‍ය වර්ෂයක් ආරම්භ වීමට මාස 03 කට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කළ යුතු වුවද සීනෝර් පදනමේ 2016 වර්ෂය සඳහා වන අයවැය ලේඛනය අනුමත කර තිබුණේ2016 දෙසැම්බර් 27 දින පැවති 315 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී ය.

(ආ) ඉහත චක්‍රලේඛයේ 5.2.5 වගන්තියට අනුව අනුමත කරන ලද වාර්ෂික අයවැය ලේඛනයේ පිටපත් මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර අදාල අමාත්‍යාංශයට, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට, මහා භාණ්ඩාගාරයට හා විගණකාධිපතිවරයාට, ඉදිරිපත් කළයුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉහත චක්‍රලේඛයේ 5.2.1 වගන්තියට අනුව වාර්ෂික අයවැය වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කරන ආකෘතියට අනුකූලව සකස් කළයුතු වුවද පදනම විසින් ඉදිරිපත් කර තිබූ වාර්ෂික අයවැය ලේඛනයෙහි අයවැයගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා අයවැයගත ප්‍රාග්ධන වියදම් ඇතුලත් ප්‍රකාශනය අන්තර්ගත වී නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා පදනමේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ඇතැම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු නොකිරීම. |
| (ආ) | මෙහෙයුම් පාලනය | බදු කුළී ආදායම නිසි පරිදි අයකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්ම | ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඈ) | මෙහෙයුම් ක්‍රියාකාරකම් | මෙහෙයුම් කටයුතු විධිමත්ව ඉටු නොකිරීම. |
| (ඉ) | කළමනාකරණ ක්‍රියාකාරකම් | බදු ගිවිසුම් ඇති කර ගැනීමේ දී සමාගමට අවාසිදායක වගන්තිවලට එකඟ වීම. |

# සමස්ථ ආදායම් ප්‍රකාශය

**2016 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට**

| | සටහන | 2016 (රුපියල්) | 2015 (රුපියල්) |
|---|---|---|---|
| **අඛණ්ඩ මෙහෙයුම්** | | | |
| ආදායම | 3 | 137,415,079.98 | 60,253,552.81 |
| විකුණුම් පිරිවැය | 4 | (114,217,715.72) | (60,025,034,.86) |
| **දළ ලාභය / (පාඩුව)** | | **23,197,364.26** | **228,517.95** |
| ඉදිකිරීම් සහ වෙළඳ කටයුතු වලින් ලැබූ දළ ලාභය | 5 | 10,935,900.18 | 112,684,030.50 |
| අනෙකුත් මෙහෙයුම් ආදායම | 6 | 44,541,340.94 | 27,687,617.29 |
| විකුණුම් හා බෙදා හැරීමේ වියදම් | 7 | (6,154,368.15) | (7,382,517.90) |
| පරිපාලන වියදම් | 8 | (62,355,475.25) | (62,208,420.12) |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 9 | (648,209.75) | (843,004.82) |
| **මෙහෙයුම් ලාභය** | | **9,516,552.23** | **70,166,222.90** |
| මූල්‍ය ආදායම | 10 | 50,265.52 | 264,143.93 |
| **අඛණ්ඩ මෙහෙයුම් වලින් ලැබූ බදු පෙර ලාභය** | | **9,566,817.75** | **70,430,366.83** |
| ආදායම් බදු වියදම් | 11 | (302,266.00) | (8,615,837.14) |
| **අඛණ්ඩ මෙහෙයුම් වලින් ලැබූ බදු පසු ලාභය** | | **9,264,551.75** | **61,814,529.69** |
| **අත්හිටුවනු ලැබූ මෙහෙයුම්** | | | |
| වර්ෂයේ අත්හිටුවනු ලැබූ මෙහෙයුම් වලින් ලැබූ බදු පසු ලාභය | | - | - |
| **වර්ෂයේ ලාභය** | | **9,264,551.75** | **61,814,529.69** |

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

**2016 වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට**

| | සටහන | 2016 (රුපියල්) | 2015 (රුපියල්) |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, යන්ත්‍ර හා උපකරණ | 12 | 321,674,585.98 | 323,039,516.30 |
| ශ්‍රී බංග්ලා බෝට්ටු ආයෝජනය | | 1,961,850.00 | 1,961,850.00 |
| | | **323,636,435.98** | **325,001,366.30** |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 13 | 41,809,722.00 | 45,872,387.62 |
| සීමාසහිත නෝත්සී සමාගම | | 9,204,498.31 | 9,204,498.31 |
| වෙළඳ ණය ගැතියෝ | 14 | 125,303,319.45 | 139,759,340.34 |
| කාර්යමණ්ඩල ණයගැතියෝ | 15 | 8,311,895.66 | 5,518,685.02 |
| අනෙකුත් ලැබීම් | 16 | 30,667,318.97 | 42,924,860.26 |
| ඉල්ලුම් තැන්පතු | | 1,300,000.00 | 1,300,000.00 |
| බැංකු හා මුදල් | 17 | 94,377,710.14 | 19,249,798.96 |
| | | **310,974,464.53** | **263,829,570.51** |
| **මුළු වත්කම්** | | **634,610,900.51** | **588,830,936.81** |
| **ස්කන්ධය හා වගකීම්** | | | |
| **ස්කන්ධය** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 40,000,000.00 | 40,000,000.00 |
| ආදායම් සංචිත | | 260,559,447.73 | 260,559,447.73 |
| ප්‍රාග්ධන සංචිතය | | 62,601,030.04 | 62,601,030.04 |
| රඳවාගත් ලාභය/ (අලාභය) | | 28,827,575.82 | 19,563,024.07 |
| **මුළු ස්කන්ධය** | | **391,988,053.59** | **382,723,501.84** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| අමාත්‍යාංශ ප්‍රධාන | 18 | 2,078,392.40 | 2,078,392.40 |
| විලම්භිත වගකීම් | 19 | 47,475,968.67 | 24,698,106.79 |
| ණයගැනීමේ පොලී | 20 | 2,844,518.16 | 4,192,885.07 |
| | | **52,398,879.23** | **30,969,354.26** |

**ජංගම වගකීම්**

| | | | |
|---|---|---|---|
| ණය ගැනීමේ පොලී | 21 | 1,348,339.08 | 1,287,955.98 |
| වෙළඳ ගැතියෝ | 22 | 42,846,961.38 | 100,926,391.50 |
| අනෙකුත් ගෙවිය යුතු | 23 | 138,912,829.63 | 64,307.895.59 |
| ගෙවිය යුතු ආදායම් බදු | 24 | 7,115,837.60 | 8,615,837.60 |
| කෙටිකාලීන ණය | 25 | - | 0.04 |
| | | **190,223,967.69** | **175,138,080.71** |
| මුළු වගකීම් | | **242,622,846.91** | **206,107,434.97** |
| මුළු ස්කන්ධය හා වගකීම් | | **634,610,900.51** | **588,830,936.81** |

# ස්කන්ධයන්ගේ වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

**2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා**

| | කොටස් ප්‍රාග්ධනය (රු.) | ප්‍රාග්ධන සංචිත (රු.) | ප්‍රත්‍යාගනන සංචිතය (රු.) | සමුච්චිත ලාභය / (අලාභය) (රු.) | මුළු ස්කන්ධය (රු.) |
|---|---|---|---|---|---|
| 2015 ජනවාරි 01 වන දිනට ශේෂය | 40,000,000.00 | 62,601,030.04 | 260,559,447.73 | (42,251,505.62) | 320,908,972.15 |
| වර්ෂයේ ශුද්ධ අලාභය | - | - | - | 61,814,529.69 | 61,814,529.69 |
| 2015 දෙසැම්බර් 31 වන දිනට ශේෂය | **40,000,000.00** | **62,601,030.04** | **260,559,447.73** | **19,563,024.07** | **382,723,501.84** |
| වර්ෂයේ ශුද්ධ අලාභය | - | - | - | 9,264,551.75 | 9,264,551.75 |
| 2016 දෙසැම්බර් 31 වන දිනට ශේෂය | **40,000,000.00** | **62,601,030.04** | **260,559,447.73** | **28,827,575.82** | **391,988,053.59** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2016 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය**

| **(සියලු අංක රුපියල් වලිනි)** | **2016** | **2015** |
|---|---|---|
| මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලැබූ මුදල් ප්‍රවාහය | | |
| බදුවලට පෙර ලාභය | 9,566,817.75 | 70,430,366.83 |
| **එකතු කලා :** | | |
| ක්ෂය කිරීම් | 18,241,569.90 | 24,430,318.28 |
| පාරිතෝෂිත වෙන් කිරීම් | 2,040,416.50 | 1,314,207.00 |
| **කාරක ප්‍රාග්ධන වියදම් වලට පෙර මෙහෙයුම් ලාභය** | **29,848,804.15** | **96,174,892.11** |
| තොගවල අඩු කිරීම් / වැඩි කිරීම් | 4,062,665.62 | 1,416,199.01 |
| වෙළඳ හා අනෙකුත් ලැබීම් වල අඩු කිරීම් / වැඩි කිරීම් | 23,920,351.54 | 197,542,032.81 |
| වෙළඳ හා අනෙකුත් ගෙවීම් වල අඩු කිරීම් / වැඩි කිරීම් | 16,525,503.92 | (244,864,792.98) |
| විලම්භිත ආදායම් අඩු කිරීම් / වැඩි කිරීම් | 21,673,555.38 | (9,633,213.22) |
| **මෙහෙයුම් ක්‍රියාවලින් උත්පාදනය කල මුදල්** | 96,030,880.61 | 40,635,117.73 |
| **අඩුකලා :** | | |
| ආයෝජන ආදායම් | (50,265.52) | (264,143.93) |
| ආදායම් බදු ගෙවීම් | (1,802,266.00) | (7,300,126.00) |
| පාරිතෝෂිත ගෙවීම් | (936,110.00) | (670,010.00) |
| **මෙහෙයුම් ක්‍රියා වලින් උත්පාදනය කරන ලද දල මුදල්** | **93,242,239.09** | **32,400.837.80** |
| **ආයෝජන ක්‍රියාවලින් ලද මුදල් ප්‍රවාහ** | | |
| දේපල යන්ත්‍ර උපකරණ මිලට ගැනීම් / විකිණීම් | (16,876,639.58) | (1,046,938.55) |

| | | |
|---|---|---|
| ආයෝජන ආදායම් | 50,265.52 | 264,143.93 |
| කෙටි කාලීන ණය | (0.04) | (10,633,248.00) |
| **ආයෝජන ක්‍රියාවලට යෙදූ ශුද්ධ මුදල්** | **(16,826,374.10)** | **(11,416,042.62)** |
| **<u>මූල්‍ය කටයුතු වලින් ජනිත වුන මුදල් ප්‍රවාහ</u>** | | |
| කල්බදු හිමියන්ට ගෙවීම් | (1,287,953.82) | (1,476,302.00) |
| **මූල්‍ය ක්‍රියාකාරීත්වයන් සඳහා යෙදූ මුදල** | **(1,287,953.82)** | **(1,476,302.00)** |
| **මුදල් හා මුදල් සමාන වත්කම් වල මුලු වැඩිවීම්** | **75,127,911.18** | **19,508,493.18** |
| **සටහන A** | | |
| මුදල් සහ මුදලට සමාන ආරම්භක ශේෂය | 20,549,798.96 | 1,041,305.78 |
| **සටහන B** | | |
| **කාල පරිච්ඡේදය අවසාන මුදල් සහ මුදලට සමාන ශේෂය** | **95,677,710.14** | **20,549,798.96** |

| | **<u>A සටහන</u>** | **<u>B සටහන</u>** |
|---|---|---|
| මහජන බැංකුව රැජින විදිය ශාඛාව - 87847 | 600,552.52 | 1,024,156.65 |
| හැටන් නැෂනල් බැංකුව - 16031 | 3,440,827.62 | 967,680.16 |
| හැටන් නැෂනල් බැංකුව - 10002143 | 26,823.58 | 26,823.58 |
| පෑන් ඒෂියා බැංකුව - 135670117 | 2,941.80 | 2,941.80 |
| සුළු මුදල් අග්‍රිමය | 167,000.00 | 162,000.00 |
| ඉන්ධන අග්‍රිමය | 50,000.00 | 50,000.00 |
| ඉල්ලුම් තැන්පතු | 1,300,000.00 | 1,300,000.00 |
| ලංකා බැංකුව - 72322913 | 12,601,106.17 | 87,919,851.48 |
| ලංකා බැංකුව කොළඹ ශාඛාව - 1450 | 2,360,547.27 | 4,224,256.47 |
| | **20,549,798.96** | **95,677,710.14** |

# 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වල සටහන්

**01. සංයුක්ත තොරතුරු**

පිහිටීම හා නීතිමය තත්ත්වය

සීමා සහිත සීනෝර් පදනම ශ්‍රී ලංකාව තුල සංස්ථාගත කළ සමාගමකි. ලියාපදිංචි කාර්යාලය අංක 335 ඩී. ආර්. විජේවර්ධන මාවත කොළඹ 10 යන ස්ථානයේ පිහිටා ඇති අතර ප්‍රධාන බෝට්ටු යාත්‍රාංගනය මට්ටක්කුලිය ප්‍රදේශයේ පිහිටා ඇත. සිල්ලර අලෙවිසැල් තංගල්ල සහ පෑලියගොඩ ප්‍රදේශවල පිහිටා ඇත.

**ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයවීම්**

රාජ්‍ය සහ පෞද්ගලික ආයතනවල ඇණවුම් වලට අනුව යාත්‍රාංගනයේ නිෂ්පාදනය කරන ලද යාත්‍රා සහ භාණ්ඩ අලෙවිය සහ අනෙකුත් ධීවර ආම්පන්න මිලදී ගැනීම සහ අලෙවි කිරීම් ලෙස සඳහන් කල හැක.

**1.3 ව්‍යවසායිකත්වයේ අයිතිය**

පූර්ණ රජය සතු සමාගමකි.

**සේවක සංඛ්‍යාව**

වර්ෂය අවසාන වන විට සමාගමේ සේවක සංඛ්‍යාව 86 විය.

**02. වැදගත් ගිණුම් ප්‍රතිපත්තිවල සාරාංශය**

සාමාන්‍ය ප්‍රතිපත්ති

සැකසීමේ පදනම

2016 දෙසැම්බර් 31 වන දිනට අවසන් වු වර්ෂය සඳහා වන සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය සමස්ථ ආදායම් ප්‍රකාශනය ව්‍යාපාර වස්තු කොටස් අයිතිය සහ මුදල් ප්‍රවාහ සහ ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් (මූල්‍ය ප්‍රකාශන) ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් සමග අනුගත වේ.

ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇති මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන උද්ධමනකාරි සාධක වල බලපෑම් වලින් තොරව සකස් කර ඇත.

**2.1.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස් වීම් සහ සංශෝධනය කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති සමග අනුගත වීම**

වර්ෂය තුල නව සහ සංශෝධිත ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් අනුගමනය කිරීම. පෙර වර්ෂවල අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මේ වර්ෂයේ ද නොවෙනස්ව පැවතින.

**2.1.3 සංසන්දනාත්මක තොරතුරු**

සමාගම විසින් ප්‍රමාණවත් පරිදි යොදා ගත් ගිණුම් ප්‍රතිපත්ති පෙර වර්ෂයේ දී යොදා ගත් ගිණුම් ප්‍රතිපත්ති වලට අනුකූල වේ. පෙර වර්ෂයේ වාර්තා වුණු සංඛ්‍යා හා වාක්‍යයන් මෙම වාර්තා වලට උචිත වන පරිදි නැවත සකස් කර ඇත.

**2.1.4 විදේශ මුදල් ගනුදෙනු**

සියලුම විදේශ විනිමය ගනුදෙනු සිදුවන අවස්ථාවේදී පැවති විදේශ විනිමය අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට මාරු කරනු ලැබේ. විදේශ මුදල් ඒකක වලින් දක්වා ඇති මුල්‍ය වත්කම් සහ බැරකම් වර්ෂය අවසානයේ පැවැති විදේශ විනිමය අනුපාතිකයන්ට අනුකූල වන සේ ශ්‍රී ලංකා රුපියල් වලට වර්ෂ අවසානයේ පැවති ස්ථානීය විනිමය අනුපාතිකයට අනුකූල වන සේ නැවත ආගනනය කරනු ලැබේ. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් අත්කරගත් ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කර ඇත.

**2.1.5 බදුකරණය**

වත්මන් බදු

ආදායම් බදු සඳහා වන ප්‍රතිපාදන මුල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති ආකාරයට 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානයන්ට අනුකූලවන සේ ගණනය කර සමාගමට අදාල කරගත යුතු අනුපාතිකයට අනුව සිදුකර ඇත.

**2.1.6 ශේෂ පත්‍රය දිනයට පසුව සිදු කළ ක්‍රියාකාරකම්**

ශේෂපත්‍ර දිනයට පසුව සිදු කරන ලද සියලුම ප්‍රධාන ක්‍රියාකාරකම් සලකා බලන ලද අතර මුල්‍ය ප්‍රකාශන වල ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කොට ඇත.

**2.1.7 ණය ගැනුම් පිරිවැය**

කාල පරිච්ඡේදය තුල දී ණය ගැනීම සඳහා වියදම ණය ගැනුම් පිරිවැය ලෙස සලකන ලදී.

**2.2 වත්කම් තක්සේරු කිරිම හා ඒවා ගණනය කිරිමේ පදනම**

**2.2.1 භාණ්ඩ ලේඛන**

භාණ්ඩ ගණනය කරනු ලබන්නේ ශුද්ධ උපලබ්ධි අගය හෝ අඩු වු පිරිවැයෙන් අභාවිත හෝ හෙමින් නිකුත් වන භාණ්ඩ වල වටිනාකම් ගැලපීමෙනි. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී විකිණීම සිදු කරන්නේ භාණ්ඩ නිම කිරීමේ පිරිවැය ගැලපීමෙන් ලැබෙන ශුද්ධ උපලබ්දි වටිනාකමය. වර්තමාන ස්ථානයට මෙම භාණ්ඩ තොගය ගෙන ඒමේදී වැය වු පිරිවැය සහ එහි තත්වය පහත සඳහන් සුත්‍රය මගින් ගණනය කරනු ලැබේ.

| | | |
|---|---|---|
| අමුද්‍රව්‍ය | - | පළමු ලැබීම් පලමු නිකුත් කිරීම් මත සත්‍ය පිරිවැය |
| නිශ්පාදිත නිමි භාණ්ඩ | - | ඍජු අමුද්‍රව්‍ය වල සත්‍ය පිරිවැය නිම කල භාණ්ඩ වල ප්‍රතිශතය අනුව ඍජු ශ්‍රමය හා ස්ථාවර පොදු කාර්යයෙන් අදාල පිරිවැය |
| නොනිමි භාණ්ඩ | - | ඍජු අමු ද්‍රව්‍ය වල සත්‍ය පිරිවැය නිමකළ භාණ්ඩ වල ප්‍රතිශතය අනුව ඍජු ශ්‍රමය හා ස්ථාවර පොදු කාර්යයෙහි අදාල පිරිවැය |

මිලදී ගත් නිමි භාණ්ඩ - පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් මත සත්‍ය පිරිවැය

අනෙකුත් තොග - පළමු ලැබීම් පළමු නිකුත් කිරීම් මත සත්‍ය පිරිවැය

### 2.2.2 වෙළඳ හා අනෙකුත් ලැබීම්

ශුද්ධ බොල් සහ අඩමාණ වෙන් කිරීම ඇස්තමේන්තු ගත වෙළඳ හා අනෙකුත් ලැබීම් අනුව දක්වා ඇත. අනෙකුත් ලැබීම් බොල් සහ අඩමාන ණය ගණනය කල ඇස්තමේන්තු අනුව දක්වා ඇත.

### 2.2.3 මුදල් හා මුදල් සමාන වත්කම්

මුදල් සහ මුදල් සමාන වත්කම් අතැති මුදල් ඉල්ලුම් තැන්පතු සහ කෙටි කාලීන ද්‍රව්‍යශීලිතාවයෙන් අග්‍ර ආයෝජන ක්ෂණිකව මුදල් බවට පත් කල හැකි දේ වන අතර වටිනාකම කිසිම විධියේ අවදානමකට භාජනය නොවන්නෙකි. මුදල් ප්‍රවහ ප්‍රකාශනවලට ඇතැම් මුදල් සහ බැංකු තැන්පතු අයිරාවල ශුද්ධ හිඟ මුදල්, කෙටිකාලීනව මෝරන ආයෝජන වන අතර ඒවා මාස 3 ක් හෝ අත්පත් කර ගත් දිනට අඩු නම් මුදල් සමාන වත්කම් ලෙස සකනු ලබයි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශ සෘජු නොවන ක්‍රමයට වාර්තා කර ඇත.

### 2.2.4 දේපල යන්ත්‍ර සුත්‍ර උපකරණ

#### (අ) පිරිවැය තක්සේරුව

සියළුම දේපල යන්ත්‍ර උපකරණ මුලික අවස්ථාවේ ගණනය කරනු ලබන්නේ පිරිවැයටය.

දේපල හා යන්ත්‍ර උපකරණ පිරිවැය ලෙස සලකන්නේ මිල දී ගැනීමේ පිරිවැය හෝ ඒවා නිර්මාණය කිරීමට දැරූ වියදමත්ය. දේපල යන්ත්‍ර උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමට සිදුවීම නිසා එම වර්ෂයේ සියළු වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමටද සිදුවේ. ප්‍රත්‍යා ගණනය ප්‍රතිපත්තියක් වශයෙන් සිදු කරනු ලබන්නේ ඒවායේ වටිනාකම ද්‍රව්‍යාත්මක වශයෙන් ඒවායේ ශේෂ පත්‍ර දිනට ඇති අගය නොවනස් නම්ය. ප්‍රත්‍යාගණනය කළ දේපලෙහි පිරිවැයක් ලෙස මුලික වශයෙන් හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස දේපල උපකරණ වල පිරිවැය ඒවායේ ක්ෂය කිරීම් අඩු කිරීමෙන් පසු දක්වා ඇත. සියළුම අනෙකුත් දේපල හා උපකරණ ඓතිහාසික පිරිවැයෙන් ක්ෂය අඩු කිරීමෙන් පසු දක්වා ඇත.

පෙරදී වියදමක් වශයෙන් හඳුනා ගෙන ඇති ප්‍රත්‍යාගනනය කළ දේපලෙහි හා වටිනාකම අඩුවීම ගැලපුවේ නැත්තම් වත්කම් ප්‍රත්‍යාගණනය කරන විට අඩුවීම කෙලින්ම ප්‍රත්‍යාගනන සංචිතයට බැරකරනු ලැබේ. මේ හේතුව නිසා ලියා හරින ලද වත්කමේ වැඩිවීමේ ප්‍රමාණය ආදායමක් ලෙස සලකනු ලැබේ. වත්කමේ අගය ප්‍රත්‍යාගනනයේ ප්‍රතිඵලයක් ලෙස අඩු වී ඇත්නම් එම අඩු වීම වියදමක් ලෙස සලකා ඇත්නම් වත්කමට අදාල පෙර එකතු කිරීම් නිසා ප්‍රත්‍යාගනන අතිරික්ත වී ඇත්නම් අදාල වත්කමේ ප්‍රත්‍යාගනන අතිරික්තය වත්කමේ අඩුව ඉක්මවා නොයයි. වත්කම් අපහරණයෙන් හෝ විශ්‍රාම ගැන්වීමෙන් වත්කමට අදාල ප්‍රත්‍යාගනන අතිරික්තයේ ඉතිරි ශේෂය සමුච්චිත ලාභයට මාරු කරයි.

**(ආ) පිරිසකර පිරිවැය**

වත්කමේ ආරම්භක ස්වරූපය පැවති කාලය මෙන් එම වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභ රඳවා ගැනීම හෝ යන්ත්‍ර උපකරණ ප්‍රතිශ්ඨාපනය කිරීම හෝ නඩත්තුව සඳහා දරන වියදමක් ලෙස සලකයි.

**(ඉ) ක්ෂය කිරීම්**

දේපල යන්ත්‍ර උපකරණ පැවතිය හැකි ජීව ආයු කාලය සලකා බලා ක්ෂය කිරීමට ක්ෂය වෙන් කිරීම් ගණනය කරනු ලැබේ. ක්ෂය කිරීම් ප්‍රතිශතය පහත සඳහන් පරිදි සඳහන් කර ඇත.

| | | | |
|---|---|---|---|
| ගොඩනැගිලි | - | 20 | අවුරුදු |
| යන්ත්‍ර උපකරණ | - | 10 | අවුරුදු |
| ගෘහ භාණ්ඩ උපකරණ | - | 05 | අවුරුදු |
| සුලු උපකරණ | - | 05 | අවුරුදු |
| කාර්යාල උපකරණ | - | 05 | අවුරුදු |
| මෝටර් රථ | - | 04 | අවුරුදු |
| පරිගණක | - | 04 | අවුරුදු |
| මෘදුකාංග | - | 05 | අවුරුදු |
| බෝට්ටු අච්චු | - | 05 | අවුරුදු |
| කර්මාන්ත උපකරණ | - | 08 | අවුරුදු |
| කුලී පදනම ලබාගත් මෝටර් රථ | - | 04 | අවුරුදු |

**(ඊ) වත්කම් වල බෙලහීනතාව (හානිකර තත්වය)**

සමාගමේ වත්කම් සෑම ක්‍රියාත්මක දිනයකදීම ඒවායේ බෙලහීන තත්වය ගැන දැන ගැනීමට හැකිවේ. එසේ බෙලහීන තත්වයක් ඇත්නම් වාර්ෂික බෙලහීන තත්වය සොයා බැලීමේ පරීක්ෂණයකදී එම වත්කම් වලින් ආපසු ලබා ගත හැකි වටිනාකම ගැන තක්සේරුවක් කරනු ලැබේ. එම වත්කම් වලින් ලබා ගත හැකි වටිනාකම එම වත්කම සාධාරණ තක්සේරු වටිනාකමින් විකුණුම් පිරිවැය අඩුකල විට එම වටිනාකමේ අගය තීරණය කරනු ලැබේ. එම වත්කම් වටිනාකම ලබාගත හැකි වටිනාකමේ බෙලහීනතාව ගැන සලකා බලා අයකරගත නොහැකි වටිනාකම ලියා හරිනු ලැබේ.

එම වත්කමේ භාවිත වටිනාකමින් ලැබෙන අනාගත මුදල් ප්‍රවාහය වත්මන් වටිනාකමට පෙර බදු වට්ටම් අනුපාතයෙන් වට්ටම් කල හොත් වත්කම් වෙළඳපොලේ වටිනාකමත්, වත්මන් මුදලේ වටිනාකමත් එම වත්කමේ දැරීමේ අවදානම ගැනත් දැනගත හැකිය.

ආදායම් ප්‍රකාශනයක හානිකර අලාභය බෙලහීන උපකරණ වල හානිකර අලාභයට පෙර ප්‍රත්‍යාගණන සංචිතයට ප්‍රතිවිරුද්ධ ලෙස ගැලපිය යුතුය. සෑම වාර්තා කරන දිනට තක්සේරුවක් කරනු ලබන්නේ පෙරදී තක්සේරු කළ හානිකර අලාභය නොපැවතීම හෝ අඩුකර දැක්වීමය. පෙරදින හඳුනාගත් හානිකර අලාභය කීර්තිනාමය හැරුණුවිට වත්කමින් නැවත අයකර ගත හැකි මුදල වැඩි වී ඇත්නම් වත්කමට ගලපනු ලැබේ. පෙර හඳුනාගත් හානිකර අලාභයට බලපෑමක් නොවේ නම් වත්කමේ වැඩි වීමක් ලෙස හඳුනාගනු ලැබේ.

## 2.3 වගකීම් හා වෙන් කිරීම්

### 2.3.1 විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්

**(අ) නිශ්චිත පාරිතෝෂිත ප්‍රතිලාභ සැලසුම**

පාරිතෝෂිත දීමනා සැලසුම් කල ප්‍රතිලාභයකි. සමාගමට පාරිතෝෂිත දීමනා පනතට අනුව ගෙවීමට හැකියාවක් ඇත. මෙම වගකීම දැරීම සඳහා ශේෂ පත්‍රයේ ඉදිරියට ගෙන ආ වෙන් කිරීමක් මුදල් වර්ෂයේ අවසානයේ ලබාගත් වැටුපෙන් වර්ෂයකට මාස භාගයක වැටුපට සමාන වත ලෙස සේවා කාලය ආරම්භයේ සිට අදාල මුදල් වර්ෂය තෙක් ගණනය කර වෙන් කිරීම් සිදු කරයි. ඉදිරිය ගෙන ආ වෙන් කිරීම වර්ෂය ආරම්භයේ ඇති වෙන් කිරීමේ ශේෂයට ගලපා වෙනස ආදායම් ප්‍රකාශනයට ඇතුලත් කරනු ලැබේ. 1983 අංක 12 දරණ පනතේ වගන්තිවලට අනුකූලව වගකීම දැරීය යුත්තේ අඛණ්ඩ සේවා කාලය වර්ෂ 5 සම්පූර්ණ කිරීමෙන් පසුවය. පාරිතෝෂිත වගකීම අරමුදල් ලැබීමක් හෝ සත්‍ය ගණනය කිරීමක් නොවේ. මෙම අයිතමය විලම්භිත වගකීමක් ලෙස ශේෂ පත්‍රයේ දක්වයි.

**(ආ) නිශ්චිත දායකත්ව සැලසුම් - සේවක අර්ථසාධක සහ සේවක භාරකාර අරමුදල්**

නිශ්චිත දායක්තව සැලසුම සේවා අර්ථ සාධක අරමුදල සහ සේවා භාරකාරීත්ව අරමුදල අදාල අනපනත් වල වගන්ති අනුව සියළුම සේවකයින් අර්ථ සාධක අරමුදලේ සහ සේවා භාර කාරීත්ව අරමුදලේ දායක්තවයෙන් ආවරණය විය යුතුය.

### 2.3.2 ප්‍රාග්ධන යෙදවුම් හා අවිනිශ්චිත අවශ්‍යතා

ශේෂපත්‍ර දිනට ඇති ප්‍රාග්ධන යෙදවුම් හා අවිනිෂ්චිත වගකීම් සියල්ල මූල්‍ය ප්‍රකාශනයේ සටහන් මගින් දක්වා ඇත.

### 2.3.3 වෙන් කිරීම්

වෙන් කිරීම් ශේෂ පත්‍රයේ දී හඳුනාගන්නේ නිත්‍යානුකූල සංවිධානයකට පසුගිය සිද්ධීන් වල නිතීමය බැදීමක් නිසා පිට ගලායා යුතු ආර්ථික වාසිය හා එම බැඳීම නිරවුල් කිරීමේ අවශ්‍යතාවය උදෙසාය.

## 2.4 ආදායම් ප්‍රකාශය

### 2.4.1 ආදායම් හඳුනා ගැනීම

ආදායම වශයෙන් හඳුනා ගනු ලබන ප්‍රමාණයට සමාගමට ගලා එන අඩමාන ආදායම හා අදායමට සම්බන්ධ වන දරන ලද පිරිවැය හෝ දැරියයුතු පිරිවැයේ විශ්වාසනීයත්වය ගණනය කිරිමයි.

**(a) භාණ්ඩ විකිණීම**

භාණ්ඩ විකුණුම් හඳුනා ගනු ලබන්නේ සැලකිය යුතු අවදානම සහ භාණ්ඩ භාරකාරිත්වයේ වාසිය සමාගමෙන් ගැනුම් කරුවා වෙත නිකුත්වීමේදී රඳවා නොගත් අයිතිය සම්බන්ධයෙන් වු ආර්ථික සබැඳියාව හෝ විකුණු භාණ්ඩයේ පාලනයයි.

**(b) පොලිය**

උපචිත පදනම මත පොලිය හඳුනා ගනු ලැබේ.

**(c) බදු කුලී ආදායම**

උපචිත පදනම මත බදු කුලී හඳුනා ගනු ලැබේ.

**(d) අනෙකුත් ආදායම්**

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගනු ලැබේ.

**(e) ලාභ සහ පාඩු**

ශුද්ධ ලාභ හා පාඩු දේපල උපලබ්ධි දියකදී යන්ත්‍ර උපකරණ ආදායම් ප්‍රකාශනයට ගනු ලබන්නේ අපහරන වියදම් විකිණීමෙන් ලැබෙන මුදලින් අඩු කිරීමෙන් පසු, දෙපලේ අගය ලෙස ගනන් ගනු ලබන්නේ අදාල දේපලහි උපලබ්දි වියදම් විකුණුම් වියදම් අඩු කිරීමෙනි ප්‍රත්‍යාගනන සංචිත ගිණුමේ ඉතිරිවන ශේෂය කෙලින්ම සමුච්චිත ලාභයට මාරු කරනු ලැබේ.

**(f) රජයේ ප්‍රධාන**

අදාල ප්‍රධානය ලැබෙන බවට සහ එම ප්‍රධානයට ඇතුලත් කොන්දේසි වලට අනුකූලව ආයතනය කටයුතු කරන බවට සාධාරණ සහතිකයක් ඇත්නම්, එම ලැබීම් රාජ්‍ය ප්‍රධාන ලෙස හඳුනා ගනු ලබයි. විලම්භිත ආදායමක් ලෙස හඳුනාගන්නා වත්කම් වලට අදාල ප්‍රධානයන් එම වත්කම් ක්ෂය කරනු ලබන කාලපරිච්ජේදය තුල කාලසීමාවේ ලාභයට හෝ අලාභයට සමානුපාතිකව ගලපනු ලබයි.

### 2.4.2 වියදම් හඳුනා ගැනීම

ආදායම් ප්‍රකාශනයේ වියදමේ පදනම ලෙස හඳුනාගනු ලබන්නේ දරණ ලද පිරිවැයත් ඉපැයු විශේෂිත අයිතම්වල ආදායම අතර වෙනසකි. ව්‍යාපාරය කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දැරූ සියළු වියදම් සහ දේපල යන්ත්‍ර සූත්‍ර නඩත්තුවට දැරූ වියදම් වර්ෂයේ ලාභය නිශ්චය කිරීම සඳහා ආදායම් ප්‍රකාශනයට මාරු කරයි.

# සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ සටහන්

| දෙසැම්බර් 31 අවසන් වර්ෂය සඳහා | 2016 රුපියල් | 2015 රුපියල් |
|---|---|---|
| <u>සටහන 3 - ආදායම</u> | | |
| යාත්‍රා විකිණීම (දේශීයව) | 134,222,416.74 | 58,195,817.95 |
| අනෙකුත් | 3,192,663.24 | 2,057,734.86 |
| | **137,415,079.98** | **60,253,552.81** |
| <u>සටහන 4 - විකුණුම් පිරිවැය</u> | | |
| ආරම්භක තොගය - අමු ද්‍රව්‍ය | 5,740,971.42 | 6,067,617.91 |
| ආරම්භක තොගය - WIP | 7,307,069.77 | 3,837,716.39 |
| ආරම්භක තොගය - FG | 2,540,086.64 | 6,176,031.29 |
| | **15,588,127.83** | **16,081,365.59** |
| එකතු කලා | | |
| අමුද්‍රව්‍ය මිලට ගැනීම් | 49,756,601.48 | 26,850,395.39 |
| අනෙක් ද්‍රව්‍ය | 14,757,507.12 | 6,601,224.61 |
| එන්ජින් | 5,930.000.00 | - |
| | **86,032,236.43** | **49,532,985.59** |
| පියවීම් තොග - අමුද්‍රව්‍ය | (4,499,882.74) | (5,740,971.42) |
| පියවීම් තොග - WIP | (14,800,626.01) | (7,307,069.77) |
| පියවීම් තොග - FG | (3,399,096.45) | (2,540,086.64) |
| පාවිච්චි කල අමු ද්‍රව්‍ය පිරිවැය | **63,332,631.23** | **33,944,857.76** |
| **එකතු කලා : සෘජු වියදම්** | | |
| වැටුප් හා වේතන | 6,414,585.50 | 4,922,688.47 |
| දිමනා - DIR | 4,643,971.39 | 3,244,302.96 |
| අතිකාල - DIR | 703,913.30 | 204,845.73 |
| සේවක අර්ථසාධක අරමුදල - DIR | 769,750.26 | 588,121.05 |
| සේවක භාරකාර අරමුදල - DIR | 192,437.58 | 208,374.24 |
| පාරිතෝෂිත - DIR | 707,091.50 | 659,647.50 |
| උප කොන්ත්‍රාත් වියදම් | 21,178,981.68 | 4,520,137.50 |
| පරීක්ෂණ සහ තත්ත්ව පාලන | 33,272.51 | - |
| ප්‍රාථමික පිරිවැය | **97,976,634.95** | **48,292,975.21** |
| **එකතු කලා : නිශ්පාදන පොදු කාර්ය** | | |
| වැටුප් හා වේතන | 1,835,844.50 | 1,767,870.34 |
| දිමනා | 967,227.83 | 1,050,653.59 |
| අතිකාල දිමනා | 185,659.52 | 102,019.71 |
| සේවක අර්ථසාධක අරමුදල | 220,301.34 | 212,144.44 |
| සේවක භාරකාර අරමුදල | 55,075.34 | 53,036.11 |

| | | |
|---|---|---|
| ක්ෂය කිරීම් | 10,185,994.22 | 6,942,393.95 |
| විදුලිය | 741,321.11 | 878,910.31 |
| උපකරණ නඩත්තු කිරීම් | 42,648.00 | 11,515.00 |
| යන්ත්‍ර සූත්‍ර නඩත්තු කිරීම් | 749,107.27 | 263,270.00 |
| වාහන නඩත්තු කිරීම් - යාත්‍රාංගනය | 71,695.88 | - |
| කුලියට ගත් යන්ත්‍ර සූත්‍ර | 38,500.00 | - |
| පිරිසිදු කටයුතු - යාත්‍රාංගනය | 359,928.00 | - |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 299,635.00 | 300,985.00 |
| ජලය | 422,192.76 | 149,261.20 |
| වෙනත් වියදම් - යාත්‍රාංගනය | 65,950.00 | - |
| **නිශ්පාදිත පිරිවැය** | **114,217,715.72** | **60,025,034.86** |

# සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ සටහන්

| වසරේ දෙසැම්බර් 31 දිනට | 2016 රුපියල් | 2015 රුපියල් |
|---|---|---|
| **සටහන 5 - වෙළඳ කාරිත්වයෙන් ලැබූ දළ ලාභය** | | |
| විකුණුම් | 59,537,125.67 | 562,900,228.22 |
| අඩු කලා විකුණුම් පිරිවැය | (48,601,225.49) | (467,800,824.40) |
| වෙළඳ ක්‍රියාකාරිත්වයෙන් ලැබු දළ ලාභය | **10,935,900.18** | **95,099,403.82** |
| ඉදිරිකිරීම් වැඩ වලින් ලැබු ආදායම | - | 112,626,415.06 |
| ඉදිකිරීම් පිරිවැය | - | (95,041,788.38) |
| | - | 17,584,626.68 |
| | **10,935,900.18** | **112,684,030.50** |
| **සටහන 06 - අනෙකුත් මෙහෙයුම් ආදායම** | | |
| බදු කුලි ආදායම | 5,251,279.85 | 16,266,501.89 |
| විවිධ ආදායම් | - | 136,500.98 |
| අවන්හලේ ආන්තික ලාභය | 399,939.60 | 629,647.60 |
| ප්‍රවාහනය සහ හසුරුවීම | 1,130,142.87 | - |
| රජයේ ප්‍රධාන | 35,991,028.62 | 9,633,213.22 |
| සැපයීම් කිරිමෙන් ලැබු කොමිස් | - | 1,021753.60 |
| වත්කම් බැහැර කිරීම මගින් ලැබීම් | 1,768,950.00 | - |
| | **44,541,340.94** | **27,687,617.29** |
| **සටහන 07 - විකුණුම් බෙදාහැරිමේ වියදම්** | | |
| ප්‍රවාහනය සහ හසුරුවීම | 405,336.91 | 320,346.84 |
| වාහන අලුත් වැඩියා හා නඩත්තු කටයුතු | 2,060,212.92 | 2,153,345.41 |
| විකුණුම් ප්‍රවර්ධනය | 262,220.00 | 219,520.00 |
| විකුණුම් කොමිස් | 541,326.72 | 803,821.11 |
| විනෝදාස්වාද කටයුතු | 36,685.00 | 37,902.00 |
| පරිත්‍යාග හා තෑගි | 87,500.00 | 396,500.00 |
| ඉන්ධන හා ලිහිසි තෙල් | 2,024,022.60 | 2,257,120.50 |
| වෙළඳ ලියවිලි වියදම | 124,819.00 | 65,900.00 |

| | | |
|---|---|---|
| මුද්දර බදු | 10,100.00 | 16,025.00 |
| වාහන කල්බදු | - | 583,000.00 |
| අලෙවිසැල් මගින් ලැබෙන බදු කුලී | 558,000.00 | - |
| බෑමේ හා පැටවුම් වියදම් | 21,200.00 | 351,695.00 |
| විකුණුම් / විරංජනය කිරීම හා ඇසිරිමේ පිරිවැය | 7,060.00 | 175,092.04 |
| ප්‍රදර්ශන වියදම් | 15,885.00 | 2,250.00 |
| | **6,154,368.15** | **7,382,517.90** |

# සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනයේ සටහන්

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | 2016 රුපියල් | 2015 රුපියල් |
|---|---|---|
| **<u>සටහන 08 - පරිපාලන වියදම්</u>** | | |
| වැටුප් හා වේතන | 20,617,225,.77 | 20,097,787.00 |
| අතිකාල | 1,190,906.71 | 1,413,360.19 |
| දීමනා | 8,647,915.70 | 11,595,686.53 |
| අර්ථසාධක අරමුදල් ගෙවීම් | 2,474,067.09 | 2,357,005.95 |
| සේවක භාරකාර අරමුදල් ගෙවීම් | 618,516.78 | 589,251.49 |
| දිරි දීමනා හා ප්‍රසාද දීමනා | 1,003,725.00 | 1,107,750.00 |
| පාරිතෝෂිත දීමනා | 1,333,325.00 | 654,559.50 |
| දුරකථන වියදම් | 1,047,540.33 | 968,453.26 |
| සුභ සාදක වියදම් | 1,553,882.70 | 1,202,151.32 |
| තැපැල් වියදම් | 48,886.52 | 36,189.50 |
| කුරියර් වියදම් | 3,910.00 | 198.00 |
| ගොඩනැගිලි නඩත්තුව | 544,089.33 | 576,918.03 |
| පරිගණක නඩත්තුව | 69,185.00 | 159,023.00 |
| ගෘහ භාණ්ඩ නඩත්තුව | 1,220.00 | - |
| කාර්යාල උපකරණ නඩත්තුව | 308,153.04 | 187,410.75 |
| ජලය | 66,764,48 | 305,575.84 |
| විදුලිය | 1,669,294.47 | 1,408,158.30 |
| මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය වියදම් | 855,967.99 | 1,134,327.65 |
| දැන්වීම් පලකිරීමේ වියදම් | 1,031,364.19 | 485,782.50 |
| ක්ෂය කිරීම් | 9,855,575.69 | 8,416,630.69 |
| නීති වියදම් | 224,060.00 | 76,587.14 |
| රක්ෂණය | 476,498.53 | 604,062.65 |
| ආරක්ෂක වියදම් | 2,150,697.36 | 3,672,456.98 |
| අන්තර්ජාලය - ඊමෙල් වියදම | 101,329.40 | 116,933.48 |
| වරිපනම් හා බදු | 151,357.00 | 1,159,219.80 |
| පවිත්‍ර කිරීම හා සනීපාරක්ෂක කටයුතු | 574,182.32 | 564,208.04 |

| | | |
|---|---|---|
| වාහන කුලී | 274,000.00 | 838,760.00 |
| බලපත්‍ර හා ලියාපදිංචි කිරීම | 124,973.16 | 84,116.44 |
| විගණන ගාස්තු | 110,000.00 | 150,000.00 |
| අධ්‍යක්ෂ පාරිශ්‍රමිකය | 505,183.90 | 1,144,616.66 |
| වෛද්‍ය වියදම් | 52,630.33 | 60,229.29 |
| පුහුණුවීම් හා සම්මන්ත්‍රණ | 170,720.00 | 163,500.00 |
| ගමන් වියදම්, පුහුණුවීම් හා සම්මින්ත්‍රණ (විදේශ) | - | - |
| ආහාර හා නවාතැන් ගැනීම | 78,764.00 | 70,497.00 |
| අධිභාර දඩ ගැසීම් වියදම් | 9,583.63 | - |
| උත්සව/ සමාජ රැස්වීම් වියදම් | 232,931.00 | 7,140.00 |
| පොත්පත් සඟරා | 860.00 | 1,179.10 |
| පැමිණීමේ දීමනා - AMC | 144,900.00 | - |
| පොදු වියදම් | - | 83,950.00 |
| වියදම් - ISO | 136,000.00 | 93,276.04 |
| ලේකම් ගාස්තු | 127,641.00 | 155,507.00 |
| උපදේශන ගාස්තු | 3,126,672.33 | 156,500.00 |
| දේශීය ගමන් වියදම් | 640,975.50 | 309,461.00 |
| | **62,355,475.25** | **62,208,420.12** |

**<u>සටහන 09 - අනෙකුත් වියදම්</u>**

| | | |
|---|---|---|
| බැංකු වියදම් හා කොමිස් | 167,125.57 | 218,658.82 |
| කල් බදු පොලී | 481,084.18 | 624,346.00 |
| | **648,209.75** | **843,004.82** |

**<u>සටහන 10 - මූල්‍ය ආදායම</u>**

| | | |
|---|---|---|
| පොලි ආදායම | 50,265.52 | 264,143.93 |
| | **50,265.52** | **264,143.93** |

**<u>සටහන 11 - ආදායම් බදු වියදම්</u>**

| | | |
|---|---|---|
| ගෙවිය යුතු ආදායමට බදු | 302,266.00 | 8,615,837.14 |
| | **302,266.00** | **8,615,837.14** |

**සටහන 12 - දේපල හා යන්ත්‍ර උපකරණ සටහන**

| පිරිවැය/ ප්‍රත්‍යාගණනය | 2016 ජනවාරි 01 වැනි දිනට | එකතු කිරීම් | අපහරනය | 2016 දෙසැම්බර් 31 වැනි දිනට |
|---|---|---|---|---|
| **නිදහස් දේපල** | | | | |
| ඉඩම් | 250,000,000.00 | - | - | 250,000,000.00 |
| ගොඩනැගිලි | 17,500,000.00 | 7,983,393.75 | - | 25,483,393.75 |
| යන්ත්‍ර සූත්‍ර | 45,109,912.00 | - | - | 45,109,912.00 |
| කර්මාන්තශාලා උපකරණ | 2,712,017.50 | 114,353.45 | | 2,826,370.95 |
| කාර්යාල උපකරණ | 2,759,433.41 | 3,950.00 | - | 2,763,383.41 |
| පරිගණක | 2,619,918.00 | 228,300.00 | - | 2,848,218.00 |
| ගෘහ භාණ්ඩ හා සවි කිරීම් | 3,307,645.19 | 15,628,38 | - | 3,323,273.57 |
| සුළු උපකරණ | 34,923,741.62 | - | - | 34,923,741.62 |
| පරිගණක මෘදුකාංග | 429,500.00 | 9,664,584.00 | - | 10,094,084.00 |
| ට්‍රේලරය හා ට්‍රැක්ටරය | 2,790,000.00 | - | - | 2,790,000.00 |
| ධීවර යාත්‍රා හා බෝට්ටු අච්චු | 9,650,948.51 | - | - | 9,650,948.51 |
| මෝටර් රථ | 15,552,350.00 | (1,133,570.00) | | 14,418,780.00 |
| **කල්බදු දේපල** | | | | |
| මෝටර් රථ | 8,099,107.57 | - | - | 8,099,107.57 |
| ට්‍රැක්ටරය හා ට්‍රේලරය | 1,300,000.00 | - | - | 1,300,000.00 |
| | **396,754,573.80** | **16,876,639.58** | **-** | **413,631,213.38** |

| ක්ෂය කිරීම් | 2016 ජනවාරි 01 දිනට ශේෂය | වර්ෂය තුල ක්ෂය කිරීම් | අපහරනය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| **නිදහස් වත්කම්** | | | | |
| ගොඩනැගිලි | 6,343,749.57 | 908,264.05 | - | 7,252,013.62 |
| යන්ත්‍රසූත්‍ර | 6,865,567.12 | 4,510,991.16 | - | 11,376,558.28 |
| කර්මාන්තශාලා උපකරණ | 2,310,157.48 | 347,541.88 | - | 2,657,699.36 |
| කාර්යාල උපකරණ | 2,010,571.31 | 302,070.68 | - | 2,312,641.99 |
| පරිගණක | 2,052,717.81 | 291,070.37 | - | 2,343,788.18 |
| පරිගණක මෘදුකාංග | 317,387.04 | 1,809,990.38 | - | 2,127,377.42 |
| සුළු උපකරණ | 22,072,356.76 | 6,984,748.34 | - | 29,057,105.10 |

| | | | | |
|---|---|---|---|---|
| ගෘහ භාණ්ඩ සවි කිරීම් | 2,559,128.45 | 205,130.16 | - | 2,764,258.61 |
| බෝට්ටු අච්චු | 7,137,877.00 | 1,152,745.52 | - | 8,290,622.52 |
| ට්‍රැක්ටර් හා ට්‍රේලර් | 2,331,695.60 | 624,999.97 | - | 2,956,695.56 |
| මෝටර් රථ | 16,951,014.57 | (664,993.12) | - | 16,286,021.45 |
| **කල්බදු දේපල** | | | | |
| මෝටර් රථ | 1,462,834.84 | 1,769,010.52 | - | 3,231,845.36 |
| ට්‍රැක්ටර් හා ට්‍රේලර් | 1,299,999.96 | - | - | 1,299,999.96 |
| | **73,715,057.50** | **18,241,569.90** | **-** | **91,956,627.40** |
| **ශුද්ධ පොත් අගය** | **323,039,516.30** | | | **321,674,585.98** |

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ සටහන්

| 2016 දෙසැම්බර් 31 දිනට | 2016 රුපියල් | 2015 රුපියල් |
|---|---|---|
| **සටහන 13 – පරිලේඛන** | | |
| අමු ද්‍රව්‍ය | 4,499,882.74 | 5,740,971.42 |
| නොනිමි වැඩ | 14,800,626.01 | 7,307,069.77 |
| නිමි භාණ්ඩ හා මුහුදු යාත්‍රා | 3,399,096.45 | 2,540,086.64 |
| නිමි භාණ්ඩ හා ධීවර උපකරණ | 19,110,116.80 | 30,284,259.79 |
| | **41,809,722.00** | **45,872,387.62** |
| **සටහන 14 – වෙළඳ කටයුතු වලින් ලැබීම්** | | |
| වෙළඳ ණය ගැතියෝ | 131,695,809.57 | 146,151,830.46 |
| අඩුකළා බොල්ණය වෙන් කිරිම | (6,392,490.12) | (6,392,490.12) |
| | **125,303,319.45** | **139,759,340.34** |
| **සටහන 15 - සේවක මණ්ඩලයේ ණය ගැතියෝ** | | |
| උත්සව අත්තිකාරම් | 65,251.20 | 55,100.00 |
| සේවක මණ්ඩල ණයගැතියෝ | 8,246,644.46 | 5,463,585.02 |
| | **8,311,895.66** | **5,518,685.02** |
| **සටහන 16 - අනෙකුත් අයවිය යුතු ලැබීම්** | | |
| අමුද්‍රව්‍ය සඳහා අත්තිකාරම් | 115,463.35 | 115,463.35 |
| වෙනත් අත්තිකාරම් | 10,612,936.57 | 7,438,334.91 |
| ලැබිය යුතු අනෙකුත් ලැබිම් | 2,116,284.39 | 2,176,284.39 |
| පෙරගෙවුම් ESC බද්ද | 2,466,894.26 | 2,466,894.26 |
| උප කොන්ත්‍රාත් | 4,909,775.05 | 4,909,775.05 |
| ආපසු ලබා ගත යුතු තැන්පත් | 591,500.00 | 591,500.00 |
| දික්ඕවිට ව්‍යාපාරය ඉදිකිරීම් | 4,670,766.18 | 5,574,536.36 |
| මරදාන දියකඩනය ඉදිකිරීම් | - | 10,491,913.70 |
| දික්ඕවිට රඳවා ගැනිම් - LS | 1,757,057.50 | (740,010.02) |
| රඳවා ගැනිමේ බද්ද | 1,119,029.73 | 1,119,029.73 |
| සේවකයින් සඳහා දුරකථන ණය මුදල් | 4,519.60 | - |
| සිනොර් අවන්හලෙන් ලැබිය යුතු මුදල් | 706,798.11 | 1,172,524.76 |
| නඩු වලින් අපේක්ෂා කිරිම් | 14,902.63 | 14,902.63 |
| බැංකු ඇපවිම් | 1,581,391.60 | 7,670,102.90 |
| නැංගුරම් පොලේ ව්‍යාපෘතිය | - | (84,814.30) |
| ප්‍රතිවිරුද්ධ සටහන් | - | 8,422.54 |
| | **30,667,318.97** | **42,924,860.26** |

**සටහන 17 - මුදල් සහ බැංකු**

| | | |
|---|---|---|
| ලංකා බැංකුව 1450 | 4,224,256.47 | 2,360,547.27 |
| මහජන බැංකුව රුපින වීදිය 033 100 141790965 | 1,024,156.65 | 600,552.52 |
| හැටන් නැෂනල් බැංකුව 16031 | 967,680.16 | 3,440,827.62 |
| හැටන් නැෂනල් බැංකුව 10002143 | 26,823.58 | 26,823.58 |
| පෑන් ඒෂියා බැංකුව 1356670117 | 2,941.80 | 2,941.80 |
| ලංකා බැංකුව 72322913 | 87,919,851.48 | 12,601,106.17 |
| සුළු මුදල් අග්‍රිමය | 162,000.00 | 167,000.00 |
| ඉන්ධන අග්‍රිමය | 50,000.00 | 50,000.00 |
| | **94,377,710.14** | **19,249,798.96** |

**ජංගම නොවන වගකීම්**

**සටහන 18 - අමාත්‍යාංශ ප්‍රධාන**

| | | |
|---|---|---|
| බෝට්ටු අච්චු අත්තිකාරම් 55 අඩි | 20,000,000.00 | 20,000,000.00 |
| අඩුකලා අවිනිශ්චිත - අඩි 55 අච්චු | (17,921,607.60) | (17,921,607.60) |
| | **2,078,392.40** | **2,078,392.40** |

**සටහන 19 - අනෙකුත් විලම්භිත නොවන බැරකම්**

| | | |
|---|---|---|
| වර්ෂය ආරම්භයේ ශේෂය | 11,496,747.50 | 10,852,550.50 |
| එකතු කළා වර්ෂයට වෙන් කිරිම් | | |
| පාරිතෝෂිත - DIR | 707,091.50 | 851,807.50 |
| පාරිතෝෂිත - ADM | 1,333,325.00 | 462,399.50 |
| | **13,537,164.00** | **12,166,757.50** |
| අඩුකලා වර්ෂය තුල ගෙවීම් | (936,110.00) | (670,010.00) |
| පාරිතෝෂිත වෙන් කිරීම් | 12,601,054.00 | 11,496,747.50 |
| විලම්භිත ආදායම | 34,874,914.67 | 13,201,359.29 |
| | **47,475,968.67** | **24,698,106.79** |

# මුල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ සටහන්

| වර්ෂයේ දෙසැම්බර් 31 දිනට | 2016 රුපියල් | 2015 රුපියල් |
|---|---|---|
| **සටහන 20 - ණයට ගැනීම්වල පොලී** | | |
| කල්බදු ණය හිමියෝ | 3,121,648.16 | 4,824,362.00 |
| අඩුකලා අවිනිශ්චිත පොලී | 277,130.01 | (631,506.93) |
| | **2,844,518.16** | **4.192.855.07** |
| **ජංගම වගකීම්** | | |
| **සටහන 21 - කල්බදු ණයහිමියෝ** | | |
| කල්බදු ණයහිමියෝ | 1,702,716.00 | 1,769,040.16 |
| අඩුකලා අවිනිශ්චිත පොලී | 354,376.92 | (481,084,18) |
| | **1,348,339.08** | **1,287,955.98** |
| **සටහන 22 - වෙළඳ ණයහිමියෝ** | 42,846,961.38 | 100,926,391.50 |
| | **42,846,961.38** | **100,926,391.50** |
| **සටහන 23 - අනෙකුත් ගෙවිය යුතු** | | |
| සේවක අර්ථසාධක අරමුදල් 20% | 457,043.50 | 413,684.05 |
| සේවක භාරකාර අරමුදල් 3% | 68,556.58 | 58,646.61 |
| GST | 650,625.86 | 650,625.86 |
| තැන්පතු | 3,011,316.95 | 2,303,000.00 |
| මුද්දර බද්ද | 7,875.00 | 5,775.00 |
| NSL ගිණුම | 1,691,290.75 | 1,691,290.75 |
| ආරක්ෂක CFHC | 1,144,306.45 | 1,144,306.45 |
| WHT | 3,368,451.75 | 3,368,451.75 |
| විකුණුම් බද්ද | 243,597.89 | 243,597.89 |
| වැට් (WHT) | 1,458,292.91 | 1,458,292.91 |
| වැට් | (11,719,949.93) | (15,190,312.10) |
| NBT | 11,543,669.75 | 10,732,825.36 |
| ESC | (138,204.81) | - |

| | | |
|---|---|---|
| බැංකු ණය | 19,619.32 | 850.00 |
| වෙළඳ අත්තිකාරම් | 113,123,957.54 | 50,037,838.39 |
| රඳවා ගැනීමේ ගිණුම | 6,459,051.45 | 6,319,371.36 |
| සුභ සාදක සමිතිය | 54,680.33 | 118,297.59 |
| වෘත්තීය සමිති ගිණුම | 50.00 | 1,850.00 |
| වන්දි ගිණුම - යාපනය | 118,569.63 | 118,569.63 |
| සුභ සාදක අරමුදල | - | 181,086.50 |
| උප කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු - BPP | 5,626,487.94 | - |
| වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් - දික්ඕවිට | - | 128,364.38 |
| වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් - මරදාන | - | (1,596,568.80) |
| වැටුප් පාලක ගිණුම | 793,798.27 | 1,768,864.01 |
| හිමිකම් නොපෑ - වැටුප් හා වේතන | 222,983.82 | 189,673.22 |
| හිමිකම් නොපෑ - පාරිතෝෂිත | 412,620.00 | - |
| ගෙවීම් ලබන්නන්ගේ ගිණුම | 5,659.00 | (18,964.90) |
| අනෙකුත් ණය හිමියෝ | 68,479.68 | 68,479.68 |
| විගණකයන්ගේ දීමනා | 220,000.00 | 110,000.00 |
| | **138,912,829.63** | **64,307,895.59** |

**<u>සටහන 24 - ගෙවිය යුතු ආදායම් බදු</u>**

| | | |
|---|---|---|
| ජනවාරි 1 දිනට ශේෂය | 8,615,837.14 | 0.46 |
| අඩුකලා වසර තුළ ගෙවීම් | (1,500,000.00) | - |
| වර්ෂයේ ආදායම් බද්ද | 302,266.00 | 8,615,837.14 |
| | 7,418,103.60 | 8,615,837.60 |
| **අඩුකලා - බදු බැර** | | |
| ESC ගෙවූ | | |
| 2011/ 12 | - | - |
| 2012/ 13 | - | - |
| 2013/ 14 | - | - |
| 2015/ 16 | (302,266.00) | - |
| ගෙවිය යුතු ආදායම් බදු | **7,115,837.60** | **8,615,837.60** |

**<u>සටහන 25 - කෙටි කාලීන ණය</u>**

| | | |
|---|---|---|
| කෙටි කාලීන ණය ගිණුම | - | 0.04 |
| | **-** | **0.04** |

# මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනයේ සටහන්

**සටහන 26 - රජයේ ප්‍රධාන**

A. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ අංශය විසින් මට්ටක්කුලිය යාත්‍රාංගනයෙහි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම උදෙසා රු. 55,519,125.08 ක් වටිනා මෙම පරිගණක මෘදුකාංගය සීනෝර් පදනම වෙත ප්‍රධානය කර ඇත. මෙම මෘදුකාංගය මගින් නවීන ධීවර යාත්‍රා සහ විනෝද යාත්‍රා නිර්මාණය කිරීමට හැකියාව ඇත. පසු අස්වනු නාස්තිය අවම කිරීම සඳහා නවීන ශීතාගාර පද්ධති වලින් සමන්විත ධීවර බෝට්ටු අච්චුවක් නිෂ්පාදනය සඳහා ධීවර දෙපාර්තමේන්තුව හරහා රු. 22,000,000.00 ක් ලැබී ඇත. තවද 2016 වර්ෂය සඳහා ලැබී ඇති රජයේ ප්‍රධාන මගින් රු. 9,991,028.62 ක මුදලක් ආදායම ලෙස හඳුනාගෙන ඇත.

B. පසු අස්වනු නාස්තිය අවම කිරීම සඳහා එම නව අච්චුවෙන් සියලු ශීතාගාර පද්ධති වලින් සමන්විත ධීවර යාත්‍රාවක් සෑදීම සඳහා රාජ්‍ය ප්‍රධාන මගින් ධීවර හා ජලජ සම්පත් සංවර්ධන දෙපාර්තමේන්තුව හරහා ලබා දී ඇති රු. 26,000.000.00 ක මුදල 2016 වර්ෂය සඳහා ආදායමක් ලෙස හඳුනාගෙන ඇත.

**සටහන 27 - අදාල පාර්ශවයේ අනාවරණය කිරීම්**

A. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශයට අනුබද්ධව ක්‍රියාත්මක වන සීමාසහිත සීනෝර් පදනම හට එම අමාත්‍යාංශය මගින් සහ එයට අනුබද්ධිත අනෙකුත් ආයතන වලින් ලබා දී ඇති ඇණවුම් මගින් රු. 89,217,039.99 ක මුදලක් 2016 වර්ෂය තුල උපයා ඇත.

B. සීමාසහිත සීනෝර් පදනමෙහි සභාපති ලෙස සේවය කරන පදනමෙහි ගණන්දීමේ නිලධාරියා එම අමාත්‍යාංශයට අනුබද්ධිත ධීවර සංස්ථාවෙහි සභාපති හා ජාතික ජලජීවී අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස ක්‍රියා කරයි.

C. සීමාසහිත සීනෝර් පදනම 2008 වර්ෂයේ බන්ග්ලාදේශයේ පිහිටි ශ්‍රී බංග්ලාස් බෝට්ටු පුද්ගලික ආයතනය සමග රු. 1,961,850.00 ක ආයෝජනයක් සහිතව ආරම්භ කරන ලද බෝට්ටු සෑදීම ව්‍යාපාරයෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සීනෝර් පදනමෙහි අධ්‍යක්ෂකවරයන් දෙදෙනෙකුගෙන්ද සමන්විත විය යුතු බව සඳහන් කර ඇත.

**සටහන 28 - වෙන් කිරීම් සහ විලම්භිත බැරකම්**

වර්ෂ 2016 තුල දී සමාගම විසින් නිෂ්පාදනය කරන ලද ෆයිබර් බෝට්ටු සඳහා වගකීම් සහතික නිකුත් කිරීම සමාගමට විලම්භිත බැරකමකි. ආර්ථික වාසිය නැති වීම නිසා හෝ ජලය කාන්දු වීමේ ප්‍රවණතාවය නිසා හෝ මේ දක්වා වගකීම් සඳහා කිසිම ගනුදෙනුකරුවකු ඉල්ලුම් කර නැත.

**සටහන 29 - ආයෝජන දේපලෙන් ලැබෙන ආදායම**

සමාගම ආයෝජන ගණනය කිරිම සඳහා ආදර්ශ පිරිවැයක් යොදාගන්නා ලදී. විශ්වාසනීයත්වය තීරණය කිරිමට සාධාරණ වටිනා කමකින් යුතු බදු ආදායමක් 2016 වර්ෂයට ලබා ගැනීමට ආයෝජන දේපලෙන් පහත දක්වා ඇති ක්‍රමයට ඇස්තමේන්තු කළ පිරිවැයක් යොදා ගන්නා ලදී.

| **ස්ථානය/අයිතමය** | **ගණන (රු)** |
|---|---|
| ජංගම වැඩහල් | 1,208,823.57 |
| මට්ටක්කුලිය ඉඩම | 397,456.28 |
| ඩී.ආර්.විජේවර්ධන මාවතේ ඉඩම | 1,620,000.00 |
| මත්තුමගල වැඩහල | 2,025,000.00 |
| **එකතුව** | **5,251,279.85** |